# මහා භාරකාරතැන වෙත පවරා ඇති බූදල් දේපළ කළමනාකරණය සම්බන්ධව ඇගයීම




**සීජ්එස්/ඩී/පීජ්/2019/02**

**පටුන**

පිටු අංකය


1. විධායක සාරාංශය.......................................................................................03

2. හැඳින්වීම.................................................................................................. 04

2.1 පසුබිම.....................................................................................................04

2.2 විගණනය සඳහා මාතෘකාව තෝරාගැනීම....................................................06

2.3 විගණන අරමුණු.........................................................................................06

2.4 විගණනයසඳහාඅධිකාරීබලය.....................................................................07

2.5 විගණන විෂය පථය..................................................................................07

2.6 විෂය පථය සීමා වීම්..................................................................................07

2.7 විගණන නිර්ණායක...................................................................................08

3. නිරීක්ෂණ.................................................................................................08

3.1 ආයතනික පසුබිම.....................................................................................08

3.2 බූදල් දේපළ නිරවුල් කිරීමේ ක්‍රියාවලිය..........................................................13

3.3 බූදල් දේපළ කළමනාකරණය ඇගයීම.........................................................18

4 නිර්දේශයන්..............................................................................................36

## 1. විධායක සාරාංශය

1922 අංක 01 දරන මහාභාරකාර ආඥා පනත යටතේ පිහිටුවන ලද මහා භාරකාර තනතුර වෙත සාමාන්‍ය භාරකරුවකු ලෙස කටයුතු කිරීම, රැකවරණ භාරකරුවකු හෝ ආරක්ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම, දේපළ රැස්කිරීමේ නියෝග යටතේ දේපළ රැස්කරන්නෙකු ලෙස කටයුතු කිරීම, බාල වයස්කරුවකුගේ දේපළ භාරකරු ලෙස කටයුතු කිරීම, සිහිවිකල් පුද්ගලයෙකුගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම ආදී කාර්යයන් පැවරී ඇත. විවිධ පාර්ශවයන් විසින් විවිධ අභිලාෂයන් ඉටුකරගැනීමේ අරමුණින් සිය දේපළවල ආරක්ෂක භාරකරු හෝ පොල්ම:කරු ලෙස පත්කර ඇති බූදල්වලට අදාලව වසර ගණනාවක සිට නිරවුල් නොවූ ගැටළු පැවතීම මෙම කාර්යසාධන විගණනය සඳහා පදනම විය.

ඒ අනුව විමර්ශන අංශයෙහි පවතින එවැනි බූදල් 15 ක් සම්බන්ධයෙන් විගණනය සිදුකරන ලද අතර එහිදී මහාභාරකාරතැනගේ වගකීම් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටුකිරීම සඳහා ගොඩනඟා ගෙන ඇති ආයතනික පසුබිම, බූදල් දේපළ නිරවුල් කිරීමේ ක්‍රියාවලිය සහ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ලද පසු එම දේපළ කළමනාකරණය කිරීම හා ඒ සම්බන්ධයෙන් ඇතිවන ගැටළුකාරී අවස්ථාවන්වලදී කටයුතු කිරීම සම්බන්ධයෙන් ඇගයීමට ලක්කරන ලදී.
එහිදී, ආයතනික අරමුණු කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය සම්පත් අවශ්‍යතා පුරෝකථනය කර සපුරා නොගැනීමත්, උපායශීලී සැලසුම් සකස් නොකිරීමත්, සංවිධාන ව්‍යුහයේ හා පරිපාලන ව්‍යුහයේ පවතින දූර්වලතාත් හේතුවෙන් මහා භාරකාරතැනගෙන් අපේක්ෂිත අරමුණ ඉටු වන ආකාරයෙන් ආයතනික පසුබිම ගොඩනගාගෙන නොමැති වීම මෙම දේපළ සම්බන්ධයෙන් වර්ෂ ගණනාවක සිට පවතින ගැටළු නිරවුල් නොවීමට හේතු වී තිබුණි. තවද, මහාභාරකාරතැන වෙත පවරා ඇති දේපළ හඳුනාගැනීම, නිරවුල් කිරීම, ආරක්ෂා කිරීම ආදී කටයුතු වෙනුවෙන් දක්වන උනන්දුව අවම වීම හා අසාමාන්‍ය කාලයක් ගත කිරීම, අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී තත්ත්වය, බූදල්කරුවන්ගේ අරමුණුවලට පටහැනි කාර්යයන් වෙනුවෙන් සම්පත් හා කාලය අනවශ්‍ය පරිදි වැය කිරීම, දේපළ නිසි ලෙස කළමනාකරණය නොකිරීම හේතුවෙන් ගැටළු ඇතිවීම ආදී කරුණු ද මෙම දේපළ සම්බන්දයෙන් පවතින ගැටළු දිගුකාලයක සිට නිරවුල් නොවීමට හේතු වී තිබුණි. මෙම සියළු කරුණු හේතුවෙන් විවිධ පාර්ශවයන් විසින් සිය දේපළ මහා භාරකාරතැන වෙත පැවරීමෙන් අපේක්ෂිත විවිධ ආර්ථික, සාමාජීය හා ආගමික අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු නොවීම දක්නට ලැබුණි.
මෙම ගැටළු හා දූර්වලතා මඟහරවා ගනිමින් බූදල්කරුවන්ගේ අරමුණු සාක්ෂාත් කිරීම සඳහා උපායශීලී සැලසුම් සකස් කිරීමත්, පරිපාලන ව්‍යුහයේ දූර්වලතා නිවැරදි කිරීමත්, එක් එක් බූදලය සම්බන්ධයෙන් වූ අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය කාලීනව ඇගයීමත්, නීතිඥවරුන් සමඟ සාකච්ඡාකර කඩිනමින් අවසන් කල හැකි නඩු කටයුතු අවසන් කිරීමත්, ඓතිහාසික වටිනාකමක් ඇති දේපළ සංරක්ෂණය සඳහා කටයුතු කිරීමත්, අරමුදල් ඵලදායී ආයෝජන

මාර්ගවල ආයෝජනය කිරීමත්, වෙනත් පුද්ගලයින් වෙත කුලී පදනමට ලබාදී ඇති දේපළ සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුම්වලට එළඹීමත්, අනවසර ඉදිකිරීම් පවතින වතුවල මැනුම් කටයුතු සිදුකර අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නෛතික පියවර ගැනීමත් ආදී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම නිර්දේශ කළ හැකිය.

## 2. හැඳින්වීම

### 2.1 පසුබිම

1931 අංක 11 සහ 1938 අංක 59 දරන ආඥා පනත් මගින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරන නීති මගින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරන පනත් මගින් ද සංශෝධිත 1922 අංක 1 දරන මහා භාරකාර ආඥා පනත යටතේ මහා භාරකාර ධූරය ස්වාධීන නෛතික පුද්ගලයෙක් ලෙස ස්ථාපිත කර ඇත.

“ 1922 අංක 01 දරන මහා භාරකාර ආඥා පනතේ සහ 1917 අංක 09 දරන භාර ආඥා පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව, ශ්‍රී ලංකා ජනරජය තුළ වලංගුව පවතින නෛතික රාමුව යටතේ, විශ්වාසනීයත්වයෙන්, අපක්ෂපාතීත්වයෙන් සහ විනිවිදභාවයෙන් යුක්තව, ශ්‍රී ලංකාවේ මහා භාරකාරතුමා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සද්භාවයෙන් ස්වකීය වෘත්තිමය වගකීම් සහ යුතුකම් සපුරා ඉටු කිරීම” මහාභාරකාර දෙපාර්තමේන්තුවේ දැක්ම වේ.

ශ්‍රී ලංකාවේ මහා භාරකාරතැන සහ මහා භාරකාර දෙපාර්තුමේන්තුව වෙත පැවරි ඇති සියලුම බලතල සහ වගකීම් නෛතික රාමුව තුළ විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාත්මක කිරීම සහ මහා භාරකාර දෙපාර්තුමේන්තුව වෙත විශ්වාසය තබමින් සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණෙන පාර්ශවයන්ට අපක්ෂපාතීව හා කාර්යක්ෂමව උපරිම සේවයක් විනිවිදභාවයෙන් යුක්තව ලබාදීම සහ ඒ තුළින් ශ්‍රී ලංකා මහා භාරකාර දෙපාර්තුමේන්තුවේ දේශීය මෙන්ම ජාත්‍යන්තරයේ ද කීර්තිනාමය වර්ධනය වන සහ පැසසුමට ලක් වන ආකාරයට කටයුතු කිරීම මහාභාරකාර දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ.

**2.1.1** මහාභාරකාර ආඥාපනත, සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මගින් පහත කාර්යභාරයන් මහාභාරකාරතැන වෙත පැවරී ඇත.

(අ) සාමාන්‍ය භාරකරුවකු ලෙස කටයුතු කිරීම.

(ආ) රැකවරණ භාරකරුවකු හෝ ආරක්ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම.

(ඇ) දේපළ රැස්කිරීමේ නියෝග යටතේ දේපළ රැස්කරන්නෙකු ලෙස කටයුතු කිරීම.

(ඈ) බාලවයස්කරුවකුගේ දේපළ භාරකරු හෝ සහය මිත්‍රයා (ආරක්ෂක කළමනාකරුවකු) ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මගින් පවරන ලද අවස්ථාවක).

(ඉ) සිහිවිකල් පුද්ගලයෙකුගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මඟින් පවරන ලද අවස්ථාවක).

(ඊ) නිශ්චල දේපළ ගිවිසුම්ගත කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම. (ආරක්ෂක භාරකරුවකු ලෙස පෙනී සිටින අවස්ථාවල දී එම භාරයන්හි පත්කර ඇති ''භාරකාර මණ්ඩලය'' මඟින් කලින් කලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පමණක් ආරක්ෂක භාරකරු බැඳී සිටී).

(උ) විදේශගත වූ ශ්‍රී ලාංකිකයකුගේ ඇටර්නි බලකරු ලෙස ඔවුන්ට අයවිය යුතු මුදල් ලබාදීම හෝ ගෙවීම සඳහා කටයුතු කිරීම.

(ඌ) සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණය මඟින් දේපළ සම්බන්ධව සහ අනෙකුත් කරුණු සම්බන්ධව කටයුතු කිරීම.

(එ) ගරු අධිකරණය මඟින් පවරන අවස්ථාවල දී අන්තිම කැමති පත්‍රයක් රහිත පුද්ගලයකුගේ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස කටයුතු කිරීම.

(ඒ) වරදකට සිරගතවූවකුගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම.

(ඔ) ඕනෑම පුද්ගලයෙකුගේ අන්තිම කැමති පත්‍රයක් සුරක්ෂිතව තැන්පත් කර තබාගන්නකු ලෙස කටයුතු කිරීම.

(ඕ) විහාරස්ථ දේපළෙහි භාරකරු වශයෙන් කටයුතු කිරීම.

**2.1.2** එම කාර්යභාරයට අදාලව දෙපාර්තමේන්තුවෙන් සැලසෙන සේවාවන් පහත පරිදි වේ.

(අ) අධ්‍යාපනය හදාරන මූල්‍යමය අතින් ඉතාමත් දුෂ්කරතා ඇති දරුවන් දිරිමත් කිරිම සඳහා ශිෂ්‍යත්ව ලබා දීම

(ආ) අසරණ හා හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වෛද්‍යාධාර ලබාදීම.

(ඇ) ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව මූල්‍යාධාර සැපයීම

(ඈ) පුණ්‍යාධාර කටයුතු

(ඉ) විවිධ හේතූන් නිසා ජීවත් වීමට අපහසු අසරණ පුද්ගලයින්ට සහ එවැනි පුද්ගලයින් සිටින ආයතනවලට ආධාර කිරීම.

(ඊ) භාර/ බූදල් දේපළ කළමනාකරණය කිරීම.

(උ) රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමින් ප්‍රතිශතයක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.

(ඌ) විහාර දේවාලගම් පනත යටතේ රජයට පවරාගන්නා ලද නිශ්චල දේපළ සඳහා හිමිවන වන්දි මුදල්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශ මත බෙදාහැරීම.

(එ) සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දරමින් එම සමාගමෙහි කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය.

(ඒ) විදේශ වන්දි ලෙස ලැබෙන මුදල් යැපෙන්නන් හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදාදීම.

(ඔ) රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමින් ප්‍රතිශතයක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.

විවිධ පාර්ශවයන් විසින් සිය අරමුණු ඉටුකිරීම සඳහා තම දේපළ අන්තිම කැමති පත්‍ර මඟින් මහා භාරකාරතැන වෙත පවරනු ලබන අතර, දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් තොරතුරු අනුව 2019 ජුලි 31 දින වන විට බූදල් 110 ක් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට අධිකරණ අවසරය ලබා දී තිබුණි. එසේ දෙපාර්තමේන්තුව වෙත පවරන ලද පවතින නෛතික රාමුව යටතේ විශ්වාසනීයත්වයෙන්, අපක්ෂපාතීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කර බූදල්කරුවන්ගේ අරමුණු ඉටුකිරීම මහා භාරකාර දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

## 2.2 විගණනය සඳහා මාතෘකාව තෝරාගැනීම

දේපළ හිමිකරුවන් විසින් තමාගේ මරණින් පසු තම දේපළවල ආරක්ෂාව තහවුරු කරගනිමින් දේපළ බෙදාහැරීම, හෝ එයින් ඉටුකිරීමට අපේක්ෂිත අරමුණු දක්වමින් මහාභාරකාරතැන වෙත අන්තිම කැමති පත්‍රය මඟින් තම දේපළ පවරා දෙනු ලබන අතර, මහාභාරකාරවරයා විසින් එම දේපළවල නෛතික භාරකාරීත්වය තහවුරු කර ගනිමින් දේපළ ආරක්ෂා කිරීමටත් අන්තිම කැමති පත්‍රය මඟින් පවරන ලද මියගිය බූදල්කරුගේ අභිමතාර්ථ ඉෂ්ඨ කිරීමටත් මහාභාරකාර ආඥපනත යටතේ බැඳී සිටී.

දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද තොරතුරු අනුව වර්තමානයේ සක්‍රිය මට්ටමේ පවතින බූදල් සංඛ්‍යාව 110 ක් වන අතර එයින් 57 ක් එනම් සියයට 50 කට වැඩි ප්‍රමාණයකට අයත් බූදල් ගොණු විවිධ ගැටළු හේතුවෙන් වසර ගණනාවක සිට විමර්ශන අංශයේ රඳවාගෙන තිබුණි. එම බූදල්වල ගැටළු නිරවුල්කර බූදල්කරුවන්ගේ අභිප්‍රායන් ඉටුකිරීමේ කාර්යසාධනය ඇගයීම සඳහා මෙම මාතෘකාව තෝරා ගන්නා ලදී.

## 2.3 විගණන අරමුණු

(අ) බූදල් දේපළ සම්බන්ධයෙන් වූ නෛතික පසුබිම පිළිබඳ පසුවිපරම් කිරීම.

(ආ) සංවිධාන ව්‍යුහය හා පරිපාලනමය දූර්වලතා සාකච්ඡා කිරීම.

(ඇ) අන්තිම කැමතිපත්‍ර භාරගැනීම හා ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

(ඈ) බූදල් දේපළ නිරවුල් කිරීමේ හා අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ඇගයීම.

(ඉ) බූදල්කරුවන්ගේ අරමුණු ඉටුකිරීමේ ක්‍රියාවලිය ඇගයීම.

## 2.4 විගණනය සඳහා අධිකාරී බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මෙම කාර්යසාධන විගණනය සිදුකරන ලදී.

## 2.5 විගණන විෂය පථය

මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් කරන ලද බූදල්, අංශ 5 ක් යටතේ කළමනාකරණය කරනු ලබයි.

| | අංශය | බූදල් සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | ආගමික අංශය | 09 |
| (ආ) | වෛද්‍යාධාර අංශය | 11 |
| (ඇ) | ශිෂ්‍යාධාර අංශය | 11 |
| (ඈ) | පුද්ගලභාර අංශය | 22 |
| (ඉ) | විමර්ශන අංශය | 57 |
| | | 110 |

බූදල්වලින් සියයට 50කට වැඩි ප්‍රමාණයක් විමර්ශන අංශය මඟින් කළමනාකරණය කරනු ලබන අතර පවත්නා සම්පත් හා කාල වේලාව මත පදනම්ව ඉන් බූදල් 15 ක නියැදියක් තෝරාගෙන එම බූදල්වලට අදාලව දේපළ නිරවුල් කිරීම, වත්කම් කළමනාකරණය, අරමුණු ඉටුකිරීමේ කාර්යසාධනය ආදිය පිළිබඳව ඇගයීමට ලක්කිරීම මෙම විගණනය මඟින් බලාපොරොත්තු වේ.

## 2.6 විෂය පථය සීමා වීම

අන්තිම කැමති පත්‍රයක් නොමැති එහෙත් දේපළ කළමනාකරණය සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලතල මහාභාරකාරතැන වෙත පවරා ඇති අවස්ථාවන්හිදී මහාභාරකාරතැන විසින් එම බූදල්හිමියන්ට අදාලව අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන දේපළ ලැයිස්තුවල සම්පූර්ණත්වය තහවුරු කිරීම සඳහා සාක්ෂි ලබාගත නොහැකි බැවින් ඒ පිළිබඳව පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2.7 විගණන නිර්ණායක

(අ) 1922 අංක 01 දරන මහා භාරකාර ආඥාපනත

(ආ) බූදල් හිමිකරුවන්ගේ අන්තිම කැමති පත්‍ර

(ඇ) බූදල්වලට අදාල නඩු තීන්දු

(ඈ) 1993 අංක 6 දරන සිවිල් නඩු විධාන සංග්‍රහයේ ප්‍රතිපාදන

(ඉ) 1950 අංක 09 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ පනත

# 3 නිරීක්ෂණ

## 3.1 ආයතනික පසුබිම

### 3.1.1 ඉදිරි සැලසුම්

මහා භාරකාරතැනගේ විෂය පථය යටතට, බූදල් හා භාර කළමනාකරණය, විහාර වන්දි හා විදේශ වන්දි නිදහස් කිරීම් සහ ශිෂ්‍යාධාර, වෛද්‍යාධාර, අසරණාධාර, පුණ්‍යාධාර ආදී ආධාර පිරිනැමීම් ඇතුළත් වේ. අංශ කිහිපයක් යටතේ මහා භාරකාරතැනට කාර්යයන් පැවරී ඇති බැවින් එම කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් උපායශීලී සැලසුම් සකස් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද තොරතුරු අනුව 2019 දෙසැම්බර් 31 දිනට සක්‍රීය මට්ටමේ පවතින බූදල් 110 ක් ද, භාර 1,112 ක් ද, විදේශ වන්දි 239 ක් ද, විහාර වන්දි 491 ක් ද පැවති අතර විවෘත නොකරන ලද හා අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ලබානොගත් අන්තිම කැමති පත්‍ර 386 ක් දෙපාර්තමේන්තුවේ සේප්පුවල හා අධිකරණයේ තැන්පත් කර තිබුණි.

විවෘත කළ බූදල් නිරවුල් කර, අරමුණු ඉටුකිරීම දක්වා වූ ක්‍රියාවලිය තෙක් ඉටුකළ යුතු කාර්යයන් හඳුනාගෙන ඒ සඳහා කාල නිර්ණයන් සිදුකර අරමුණු ඉටුකිරීම සඳහා කාර්යක්ෂමව යොමුකිරීම වෙනුවෙන් දිගුකාලීන හා කෙටිකාලීන සැලසුම් සකස් කිරීමේත් විවෘත නොකළ අන්තිම කැමති පත්‍රවලට අදාලව අන්තිම කැමතිපත්‍රකරුවන්ගේ තොරතුරු කාලානුරූපව යාවත්කාලීනව තබා ගැනීමේත් අවශ්‍යතාවයන් නිරීක්ෂණය විය. තවද, විහාර වන්දි හා විදේශ වන්දි නිදහස් කිරීම්වලට අදාලව වන්දි හිමිකරුවන් හඳුනාගැනීමේ ක්‍රියාවලිය සඳහා කාල රාමුවක අවශ්‍යතාවය නිරීක්ෂණය විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ අරමුණුවලට අදාල කාර්යභාරයන් නිශ්චිතව නිර්ණයකර එම කාර්යයන්ගේ වගකීම පැවරිය යුතු නිලධාරීන් හා ඒ සඳහා ගතවන කාලය හඳුනාගෙන විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් නොකිරීම හේතුවෙන් අරමුණුවලට ළඟාවීම දුෂ්කර වී තිබුණි.

### 3.1.2 තොරතුරු පද්ධතිය

දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන භාර හා මුදල්වට අදාලව සක්‍රීය, අක්‍රීය, තාවකාලිකව වසා දමා ඇති, නිරවුල් කිරීමට පියවර ගත යුතු, නඩු කටයුතු පවතින, අරමුණු ඉටුකිරීම සඳහා යොමුකර ඇති ආදි වශයෙන් ද, විහාර හා විදේශ වන්දිවලට අදාලව වන්දිලාභීන් හඳුනාගත්, ගෙවීම් සඳහා ගැටලු පවතින, ගෙවා අවසන් කළ ආදි වශයෙන්ද දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂම අයුරින් ඉටුකිරීම සඳහා විධිමත් තොරතුරු පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගැනීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය වුවද එවැනි විධිමත් පද්ධතියක් නොවීය. තවද, අලුතින් භාරගනු ලබන අන්තිම කැමති පත්‍ර සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රකරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, යැපෙන්නන් පිළිබඳ විස්තර, ආදායම් බදු ලිපිගොනු අංකය, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම ආදි තොරතුරු ක්‍රමානුකූලව පවත්වා නොගැනීමෙන් එම අන්තිම කැමති පත්‍ර සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේ ගැටලුකාරී තත්ත්වයන් පැවතුණි.

විධිමත් තොරතුරු පද්ධතියක් පවත්වා නොගැනීම හේතුවෙන් නිවැරදි හා යාවත්කාලීන තොරතුරු ලබාගැනීමේ අපහසුතා නිරීක්ෂණය විය.

උදා -: (අ) විගණනය වෙත ලබාදුන් මුදල් සංඛ්‍යාව, ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් මුදල් සංඛ්‍යාව හා වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි සඳහන් මුදල් සංඛ්‍යාව අතර වෙනස්කම් පැවතීම

(ආ) අක්‍රීය හා තාවකාලිකව වසා තබා ඇති මුදල් පිළිබඳ විධිමත් තොරතුරු නොවීම.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සකස්කර නොමැති මුදල්/භාර පැවතීම

(ඈ) ලිපිගොනු අස්ථානගත වීම් නිරීක්ෂණය වීම.

(ඉ) මුදල්/භාර ආරම්භ කළ දිනය, අරමුණ, භාර ස්ථාපකගේ තොරතුරු, ලිපිගොනු පවතින අංශ, වර්තමාන තත්ත්වය ආදිය පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබාගැනීමේ ක්‍රමවේදයක් නොවීම.

(ඊ) ඇතැම් භාරයන් සම්බන්ධ අර්ථලාභීන්/භාරයන් පිහිටවූ පුද්ගලයින්ගේ තොරතුරු ආදිය නොමැති වීම මත භාරයේ අරමුණු ඉටු නොවූ අවස්ථා පැවතීම (බ්‍රිතාන්‍ය ශ්‍රී ලංකා සමාගම් භාරය, ෆ්ලෝරන්ස් ඊනිඩ් විදම් මුදලය).

(උ) 2019 දෙසැම්බර් 31 දිනට වැඩ කටයුතු ආරම්භ නොකළ අන්තිම කැමති පත්‍ර 386 ක් පැවති අතර එයින් 1931 වර්ෂයේ සිට 1992 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ 254 ක් හා 1992 වර්ෂයට පසුව 132 ක් මහා භාරකාරතැන වෙත භාර දුන් අන්තිම කැමති පත්‍ර වේ. එම අන්තිම කැමති පත්‍රකරුවන් සම්බන්ධයෙන් තොරතුරු විධිමත් පරිදි නඩත්තු කර කාලීනව ඔවුන් සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කර ගැනීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව තුළ නොවීය. එබැවින් 1992 වර්ෂයට පෙර තැන්පත් කරන ලද අන්තිම කැමති පත්‍ර

සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා 2018 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් හා පුවත්පත් දැන්වීමක් මඟින් තොරතුරු කැඳවා තිබුණු අතර එහිදී මිය ගිය 50 දෙනෙක් හා ජීවත්ව සිටින 16 දෙනෙක් සම්බන්ධ තොරතුරු පමණක් ලබාගත හැකි වී තිබුණි. තොරතුරු කැඳවූ 254 න් 188 ක් සඳහා තොරතුරු ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් එම අන්තිම කැමතිපත්‍රවල සඳහන් අරමුණු ඉටුකළ නොහැකි තත්ත්වයක් නිරීක්ෂණය විය.

1992 වර්ෂයට පසු තැන්පත් කළ අන්තිම කැමතිපත්‍ර සම්බන්ධ තොරතුරු රැස්කිරීම සඳහා කිසිදු සැලසුමක් සකස් කර නොතිබුණි.

මෙම දුර්වලතා හේතුවෙන් අරමුණු ඉටුකිරීම සඳහා අනවශ්‍ය කාල ප්‍රමාදයක් සිදුවන බවත්, කාර්ය සාධනය ඇගයීම අපහසු බවත් නිරීක්ෂණය විය.

### 3.1.3 භෞතික සම්පත්

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල ඩී.බී. ජයතිලක බූදලයට අයත් ගොඩනැගිල්ලක් වන අතර කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් ඒ තුළ නොවන බව නිරීක්ෂණය විය. වර්ෂ ගණනාවක සිට නඩත්තු කටයුතු සිදුනොකිරීම හේතුවෙන් ගොඩනැගිල්ලේ වහල දිරාපත් වී තිබුණු බැවින් දෙපාර්තමේන්තුවට අයත් අංශ කිහිපයක් යාබද ගොඩනැගිල්ලෙහි ස්ථානගත කර තිබුණි. තවද, විදුලි පද්ධතියෙහි දෝෂ පවතින බව නිරීක්ෂණය වූ අතර වසර 100 කට අධික ඉතිහාසයකින් හෙබි මෙම ගොඩනැගිල්ල අළුත්වැඩියා කර කාර්යාලය පවත්වාගෙන යාම හෝ සංරක්ෂණය කර වෙනත් සුදුසු කටයුත්තකට යෙදවීම හෝ කෙරෙහි අවධානය යොමුකළ යුතුව පැවතුණි.

### 3.1.4 මානව සම්පත් කළමනාකරණය

2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත, නිත්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිවෙලින් 87, 69 හා 18 ක් වූ අතර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂව හා ඵලදායී අයුරින් ඉටුකළ හැකි පරිදි කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීමටත් කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමටත් අවශ්‍ය කටයුතු ඉටුකර නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

(අ) දෙපාර්තමේන්තුව සඳහා අත්‍යාවශ්‍ය තනතුරක් වන පරිපාලන නිලධාරී තනතුර 2015 ජූලි සිට පුරප්පාඩු පවතින අතර භාෂා පරිවර්තක තනතුරද 2016 ජනවාරි සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2018 මැයි 21 දින නීති නිලධාරී තනතුරක් අනුමත කරගෙන තිබුණද ඒ සඳහා නිලධාරියෙකු බඳවාගෙන නොතිබුණි. විමර්ෂණ අංශය සඳහා නීතිය පිළිබඳ දැනුම ඇති

නිලධාරීන්ගේ අවශ්‍යතාවය නිරීක්ෂණය වූ අතර බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමේදී ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන වතු සඳහා බඳවා ගෙන ඇති වතු අධිකාරවරුන්ට ලිඛිතව වැඩ පැවරීමක් සිදුකර නොමැති අතර විධිමත් පරිදි අධීක්ෂණයක් හා කාර්යසාධනය මැනීමේ ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) දෙපාර්තමේන්තුවෙහි විවිධ අංශ අතර නිලධාරීන්ගේ කාර්යභාරයන් නිතර නිතර මාරු කිරීමත්, එහිදී විධිමත් පරිදි ලිපිගොනු භාරදීම හා භාර ගැනීම සිදුනොකරන බවත් මේ සම්බන්ධයෙන් අංශ ප්‍රධානීන්ගේ අධීක්ෂණය අවම මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය.

(ඉ) 2018 ජනවාරි 24 දිනැති හා 02/2018 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා කාර්යමණ්ඩලය සතුවිය යුතු නිපුණතා හා මේ වනවිට පවතින නිපුණතා පිළිබඳ ඇගයීමක් කර නිපුණතා පරතරය අවම කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 3.1.5 පරිපාලනමය ව්‍යුහය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය තීරණය කිරීමේදී අරමුණු කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටුකළ හැකි ආකාරයට සංවිධාන ව්‍යුහය සකස්කර ගත යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එසේ සිදුකර නොතිබුණි.

(i) දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණය වන මහාභාරකාර තනතුර හා නියෝජ්‍ය මහාභාරකාර තනතුරු දෙක සඳහා නිරන්තරයෙන්ම නීති වෘත්තිකයන් පත්කර තිබූ අතර පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ජ්‍යේෂ්ඨ මට්ටමේ තනතුරක් දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය තුළ දක්නට නොවීය. එබැවින් ලිපිගොනු පරිපාලනය, කාර්යාල ක්‍රම හඳුන්වාදීම, අධීක්ෂණය, යන කටයුතුවලදී යාවත්කාලීන තොරතුරු පවත්වාගෙන යාම, විගණනය ඇතුළු තොරතුරු පරිශීලනය කරන පාර්ශව වෙත අප්‍රමාදව තොරතුරු ලබා දීම, අදාල කාර්යභාරයන් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම ආදිය සම්බන්ධයෙන් ගැටළු නිරීක්ෂණය විය.

(ii) අධිකාරි බලය ඉහළ සිට පහළට ක්‍රමානුකූලව ගලායන ආකාරයට සංවිධාන ව්‍යුහය නිර්මාණය කළ යුතු වුවත්, පුද්ගල භාර හා විදේශ වන්දි යන අංශවල සංවර්ධන නිලධාරී තනතුරුවල නිලධාරීන් සිටියද දෙපාර්තමේන්තුවේ යතුරු ලේඛක හා පරිගණක ලිපිකරු තනතුරු දරන නිලධාරීන් අංශ ප්‍රධානීන් ලෙස පත්කර තිබුණි.

(iii) ලිපිගොනු ලේඛන නඩත්තු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන බුදල් බොහොමයක් දශක 7 කට අධික කාලයක සිට පැවත එන බැවින් එම බුදල්වලට අදාල අන්තිම කැමති පත්‍රය, අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය, වැදගත් නඩු තීන්දු, ඉඩම්වලට අදාල ඔප්පු ආදිය ඇතුළත් ලිපිගොනු ආරක්ෂිතව පවත්වාගනිමින් කළමනාකරණය කළ යුතු වුවත් එම ලිපිගොනුවල භෞතික ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවර අනුගමනය කර නොතිබුණි. ලිපිගොනු ලේඛන නඩත්තු කිරීමේදී පවතින දුර්වලතා, රාජකාරී පැවරීමේ දුර්වලතා, රාජකාරී මාරුකිරීමේදී විධිමත් පරිදි ලිපිගොනු පැවරීමේ දුර්වලතා නිරීක්ෂණය වූ අතර ගොඩනැඟිල්ලට භෞතිකව සිදුවිය හැකි හානි හේතුවෙන් ලිපිගොනුවලට හානි ඇතිවීමේ අවධානම පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි. එවැනි දුර්වලතා හේතුවෙන් ලිපිගොනු අස්ථානගතවූ අවස්ථා මෙන්ම අත්‍යාවශ්‍ය තොරතුරු ලිපිගොනු තුළ නොමැති වූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුවේ භාර හා බුදල් සම්බන්ධ ගනුදෙනු සටහන් කිරීම වෙනුවෙන් පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක් පවත්වාගෙන යනු ලැබුව ද, ඒ තුළ එක් එක් භාර/බුදල් සම්බන්ධයෙන් එක් ලෙජර් ගිණුමක් (ආදායම් හා වියදම් ගිණුමක්) පමණක් දක්නට ලැබුණි.

(i) එම එක් එක් භාරය/බුදලය සඳහා වන ආයෝජන, බැංකු ශේෂ ඇතුළු අනෙකුත් ශේෂ සඳහා ලෙජර් ගිණුම් නොවූ බැවින් එක් එක් භාර/බුදල් සඳහා වෙන් වෙන් වශයෙන් ශේෂ පිරික්සුමක් සකස් කළ නොහැකි බව නිරීක්ෂණය විය. එබැවින් එක් එක් වර්ෂය අවසාන දිනට ශේෂ පත්‍ර හා ආදායම් ප්‍රකාශයන් ලේඛනගත ක්‍රමයට (Manual) සකස් කරනු ලබන අතර තෝරාගත් නියැදියට අදාලව මූල්‍ය ප්‍රකාශන සකස් කර නොමැති සහ මූල්‍ය ප්‍රකාශන සකස් කළද ඇතැම් වත්කම් ගිණුම්ගත කර නොමැති අවස්ථා නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම 01 හි දැක්වේ.

(ii) තවද, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා උපයෝගී කර ගත් ගිණුම්කරණ රාමුව (පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ආදි ලෙස) හා ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපත්තියක් තීරණය කර ක්ෂය වීම් කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. එක් එක් භාර/ බුදල් සඳහා වූ ආයෝජන වෙන් වෙන් වශයෙන් දැක්වෙන පරිදි විධිමත් ආකාරයට නඩත්තු කරන ලද ආයෝජන ලේඛනයක් නොවූ අතර ඇතැම් අංශවල පැවති ලේඛනවල මකන දියර යොදා වෙනස්කම් කිරීම්,

අපහැදිලි ලෙස සටහන් කිරීම් දක්නට ලැබුණි. මෙම වෙනස් කිරීම් සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරියෙකුගේ අවධානය යොමුවී නොතිබුණි.

## 3.2 බූදල් දේපළ නිරවුල් කිරිමේ ක්‍රියාවලිය

### 3.2.1 දේපළ හඳුනාගැනීම

විවිධ පාර්ශවයන්ගේ දේපළ සම්බන්ධයෙන් මහා භාරකාරතැන දේපළ කළමණාකරු ලෙස පත්කර ඇති අවස්ථාවන්හි දී එම දේපළට අදාල නිශ්චල හා චංචල දේපළ හඳුනාගෙන නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම මහා භාරකාරතැනගේ වගකීම වේ. එහෙත්, එම දේපළ සම්බන්ධයෙන් වු ඉඩම් නිරවුල් කර ගැනීමේ කටයුතු පිළිබඳ පරීක්ෂා කිරීමේදී, ඉඩම් හඳුනාගැනීම හා නිරවුල් කිරීමේ කටයුතු සතුටුදායක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය. නියැදි පරීක්ෂාවට ලක්වූ දේපළ කිහිපයකට අදාල නිරීක්ෂණ පහත පරිදි විය.

(අ) ඩී. එස්. ඩබ්ලිව් සමරකෝන් බූදලයට අයත් අක්කර 141 රූඩ් 2 පර්චස් 9.62 ක් වු රෙජිඩේල් වත්ත ඉඩමෙන් අක්කර 134 රූඩ් 1 පර්චස් 25.92ක් 1964 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා කාලය තුළදී රජයට පවරා ගෙන තිබුණු අතර, රූඩ් 1 පර්චස් 2.62 ක් අධිකරණ අවසරය මත බදු පදනමට බාහිර ආයතනයකට ලබාදී තිබුණි. එබැවින් මුළු ඉඩමෙන් අක්කර 6 පර්චස් 21.08 ක් තවදුරටත් ඉතිරිව පැවතිය යුතු වුවත් දේපළ සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලතල ලද 1960 නොවැම්බර් 09 දින සිට 2020 ජනවාරි වනවිට අවුරුදු 60 ක් ගත වී ඇතත් ඒ සම්බන්ධයෙන් පරීක්ෂාවක් කර අයිතිය සනාථ කර ගෙන නොතිබුණි.

(ආ) සමරකෝන් බූදලය සඳහා 1973 ඔක්තෝබර් 17 දින දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද දේපළ ලැයිස්තුවෙහි සඳහන් ඇතැම් නිවාස, වතු හා කුඹුරු ඉඩම් භෞතිකව හඳුනාගෙන අයිතිය නිරවුල් කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද, එදිනට වටිනාකම රු.1,520,736 ක් වු ආයෝජන, ගෘහ භාණ්ඩ හා රථවාහනවලින් සමන්විත චංචල දේපළ සම්බන්ධයෙන්ද දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. හඳුනානොගත් වටිනාකම රු.63,100 ක් වූ නිවාස, වතු හා කුඹුරු ලැයිස්තුව ඇමුණුම 2 හි දැක්වේ.

(ඇ) හැරී හපුගොඩ මහතාගේ අන්තිම කැමති පත්‍රය අනුව බද්දේගම පිහිටි සුදුවැලිපොත වත්ත හා මත්තක පිහිටි වතු ඉඩම් දෙක හැර ඉතිරි ඉඩම් කොටස් විකුණා ඔහුගේ භාරයට බැර කරන ලෙස දක්වා තිබුණු අතර 1961 මැයි 16 දින මෙම බූදලය සඳහා අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී තිබුණි. අන්තිම කැමති පත්‍රය සමඟ ඇති දේපළ ලැයිස්තුව අනුව මෙම බූදලයට ඉඩම් කොටස් 138 ක් අයත්ව පැවති අතර ඉන් අක්කර 35 පර්චස් 36.8 ක් වු ඉඩම් කොටස් 17 ක් හැරී

හපුගොඩ මහතාට නිරවුල් අයිතිය පැවති අතර ඉතිරි කොටස් 121 ක් නොබෙදූ ඉඩම් විය. අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ලැබී වර්ෂ 58 ක කාලයක් ගත වී තිබුණ ද මෙම ඉඩම් හඳුනාගෙන මැනුම් කටයුතු සිදුකර අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් පරිදි ඉඩම් විකිණීමට කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. එබැවින් හැරී හපුගොඩ මහතාගේ අන්තිම කැමති පත්‍රයෙහි අරමුණු ලෙස දක්වා තිබූ ලංකා විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෙකුට ශිෂ්‍යාධාර ලබාදීම, දකුණු පළාතේ සිදුවන ස්වභාවික ආපදාවලදී මූල්‍යාධාර ලබාදීම ආදී අරමුණු ඉටුකළ නොහැකි වී තිබුණි.

### 3.2.2 රජයට පවරාගත් දේපළ සම්බන්ධයෙන් කටයුතු කිරීම

මහාභාරකාරවරයා පොල්මඃකරු වශයෙන් පත්කර ඇති ඇතැම් බූදල්වලට අදාල ඉඩම් රජය විසින් වරින් වර අත්පත් කර ගත් අවස්ථා නිරීක්ෂණය වූ අතර එවැනි අවස්ථාවන්හිදී 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 10 වගන්තිය ප්‍රකාරව වන්දි හා පොළී මුදල් සඳහා දේපළ හිමිකරු හිමිකම් ලබයි. එබැවින් එම ඉඩම්වලට අදාල අයිතිය තහවුරු කර ලැබිය යුතු වන්දි කඩිනමින් ලබාගෙන බූදල්කරුගේ අරමුණු ඉටුකිරීම වෙනුවෙන් එම මුදල් යෙදවීම මහාභාරකාරතැනගේ වගකීම වේ. ඇතැම් ඉඩම් රජයට පවරාගෙන සැලකිය යුතු කාලයක් ගතවී තිබුණද අදාල වන්දි හා පොළී මුදල් ලබාගෙන බූදලය වැඩිදියුණු කර බූදල්කරුගේ අරමුණු ඉටුකිරීමට අපොහොසත් වූ අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

(අ) ඩී. එස්. ඩබ්ලිව් සමරකෝන් බූදලයට අයත් සයිමන්ඩේල්වත්ත ඉඩමෙහි අක්කර 16 රූඩ් 01 පර්චස් 35කින් සමන්විත කැබලි අංක 01 සහ 02 1982 අගෝස්තු 27 දින රජයට පවරාගෙන තිබුණු අතර, ඒ සඳහා රු.2,634,500 ක වන්දි මුදලක් හිමි බවට 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ තීරණය කර 2013 ජනවාරි 16 දින කැස්බෑව ප්‍රාදේශීය ලේකම් විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවට දැනුම් දී තිබුණි. එහෙත් 2014 නොවැම්බර් 20 දිනැති කැස්බෑව ප්‍රාදේශීය ලේකම්ගේ ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට හිමි වන්දි මුදල රු.1,791,000 ක් බව දන්වා තිබුණි. අත්කර ගැනීමේ නිලධාරී විසින් දැනුම්දෙන ලද වන්දි සම්බන්ධ තීරණය පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් එම තීරණය ලැබී දින 21 ක් ඇතුළත වන්දි සමාලෝචන මණ්ඩලයට ඇපෑලක් ඉදිරිපත් කළ හැකි වුවත් දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු කර නොතිබුණු අතර අහිමි වූ වන්දි සම්බන්ධ ගැටලුව 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි.

පසුව දැනුම් දෙන ලද වන්දි මුදල වන රු.1,791,000 න් 2019 දෙසැම්බර් 31 දින වනවිට රු.1,050,000 ක් පමණක් ලැබී තිබුණු අතර ඉතිරි මුදල වන රු.741,000 ක් තවදුරටත් අයකර ගෙන නොතිබුණි. තවද, ඒ සඳහා රු.1,937,095 ක පොළී මුදලක්ද, 2019

අගෝස්තු 13 දින ලද රු.770,000 ක් වෙනුවෙන් රු.2,012,905 ක පොළී මුදලක් ද, 2019 දෙසැම්බර් 31 දිනට තවදුරටත් දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතුව පැවතුණි.

(ආ) ඉහත සඳහන් කරන ලද බූදලයට අයත් මොරටුව මත්තේබොඩ කුඹුරු ඉඩම නැමැති ඉඩම 1085/1 අංක හා 1999 ජුනි 21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥාපනතේ 38(අ) අතුරු විධිවිධානය යටතේ රජයට අත්පත් ගෙන තිබුණි. හෙක්ටයාර් 1.375 කින් යුත් මෙම ඉඩම අංක 8270 දරන පිඹුර මගින් ලොට් අංක 1, 2, 3, 4 හා 5 යනුවෙන් කොටස් කර තිබූ අතර, ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනතේ (460 වැනි පරිච්ඡේදය) 10 (1) (අ) වගන්තිය යටතේ දැන්වීම් නිකුත් කරමින් ලොට් අංක 1, 2 සහ 5 යන කොටස්වල මහා භාරකාරතැනගේ අයිතිය සනාථ කර තිබුණු අතර ඒ අනුව රු.885,000 ක වන්දි මුදලක් ලැබී තිබුණි. එහෙත් ඒ සඳහා ගැසට් නිවේදනය පලකළ දින සිට වන්දි ගෙවන දිනය දක්වා වූ කාලය සඳහා වන්දි මුදලට අමතරව හිමිවිය යුතු සියයට 7ක වාර්ෂික පොළිය වූ රු.841,827 ක් අයකර ගැනීමට 2020 ජනවාරි වනවිටත් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉහත සඳහන් කරන ලද බූදලයට අයත් ඔයගාව වත්ත, උඩවත්ත, කටුපොළයාවත්ත වැවල නැමැති ඉඩමෙන් අක්කර 4 රූඩ් 3 පර්චස් 39 ක් අවස්ථා 4 කදී රජයට පවරාගෙන තිබුණු අතර එම දේපළවලට අදාල වන්දි මුදල් ලබාගත් බවට දෙපාර්තමේන්තුව තුළ සාක්ෂි නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂාකර, ලැබිය යුතු මුදලක් වේ නම් එය බූදලය නමින් ලබාගැනීමට කටයුතු කළ යුතු වුවත් ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

| ඉඩම | පවරාගත් දිනය | පවරාගත් දිනට ගණනය කළ වන්දි මුදල |
|---|---|---|
| ------- | ---------------- | --------------------------- |
| | | රු. |
| අක්කර 1 රූඩ් 1 පර්චස් 0.05 | 1973.09.22 | 40,000 |
| රූඩ් 1 පර්චස් 0.03 | 1974.12.13 | 22,103 |
| රූඩ් 1 පර්චස් 3.8 | 1977.01.28 | 31,500 |
| රූඩ් 1 පර්චස් 36 | 1989.05.13 | 1,225,000 |
| | | 1,318,603 |

(ඈ) සී.ඊ වනිගසූරිය බූදලයට අයත්ව තිබුණු 2009 වර්ෂයේ දී රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය වෙත පවරා දී තිබූ කඩවත,

ඌරලිංකනත්ත නැමැති අක්කර 01 රූඩ් 2 පර්චස් 24.18 ක ඉඩම් ප්‍රමාණයට අදාලව වනිගසූරිය භාරය වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි.

### 3.2.3 අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම

යම්කිසි බූදලයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම අධිකරණය විසින් අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් මඟින් මහාභාරකාරතැන වෙත ලබාදෙනු ලබන අතර එවැනි අවස්ථාවන්හිදී එම බූදලය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය එහි ඇතුළත් වේ. ඒ අනුව එසේ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් නොලද බූදල්වලට අදාල දේපළ කළමනාකරණය කිරීමේ අයිතියක් මහා භාරකාරතැන වෙත නොමැති වුවත් ඊට පටහැනිව කටයුතු කළ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) පුෂ්පා හේවාවිතාරණ නානායක්කාර මහත්මියගේ දේපළ කළමනාකරණය සඳහා මහාභාරකාරතැන වෙත අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී නොතිබුණු අතර ඇයගේ නමින් භාරයක් ද දෙපාර්තමේන්තුව සතුව නොතිබියදී 2001 ජුනි 28 දින පුෂ්පා හේවාවිතාරණ නානායක්කාර නමින් රු.5,010,500 ක් බාහිර පාර්ශවයකින් බාරගෙන ආයෝජනය කර තිබුණි. මුලධනයෙන් ආපසු ගෙවීම් ලෙස සඳහන් කරමින් 2011 දෙසැම්බර් 23 දින රු.4,000,000 ක් ආපසු ගෙවා තිබුණු අතර අරමුදල් කළමනාකරණය කිරීමේ අරමුණක් නොපැවතියද භාර අරමුණු සඳහා ගෙවීම් ලෙස සඳහන් කර 2002 සැප්තැම්බර් 13 දින රු.1,500,000 ක් හා 2002 ජනවාරි 31 දින පුණ්‍යාධාර ලෙස රු.221,075 ක් ගෙවා තිබුණි. 2019 නොවැම්බර් 24 දිනට රු.190,782 ක බැංකු ශේෂයක්ද, ස්ථාවර තැන්පතුවල රු.1,700,194 ක ආයෝජනයක්ද දක්නට ලැබුණි.

(ආ) මනෝහාරි සුනිල් කාන්ති මඩුගල්ල නැමැති මන්දමානසික තැනැත්තියගේ දේපළවල භාරකරු සහ කළමනාකරු ලෙස කටයුතු කිරීම සඳහා මහාභාරකාරතැන විසින් 2014 ජුනි 30 දින කොළඹ දිසා අධිකරණයේදී පැවති නඩුවට අදාලව එකඟතාවය පළකර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් නඩු වාර්තාවේ නියෝගයක් හෝ කළමනාකරණ සහතිකයක් මඟින් පවරා දීමක් සිදුකර නොතිබුණි. එසේ වුවද, දේපළ හිමිකාරිනියට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ හැටහයේ කෝරලේ පිහිටි පීල්පොත නම් වූ අක්කර 25 රූඩ් 3ක් වපසරියකින් යුතු කුඹුරු හා ගොඩ ඉඩම් කළමනාකරණ කටයුතු සඳහා දෙපාර්තමේන්තුව සම්බන්ධවී තිබුණි. මෙම දේපළ යටතේ අද මුදල් ලෙස රු.322,715 ක් රැස්කර තිබුණු අතර රු.110,870 ක් නීති ගාස්තු, ගමන් වියදම් ඇතුළු විවිධ වියදම් සඳහා දරා තිබුණු අතර 2019 අගෝස්තු 07 දින ඉතිරි ශේෂය රු.211,846 ක් ආයෝජනය කර තිබුණි.

### 3.2.4 නෛතික සහය ලබාගැනීම

විස්තර පහත පරිදි වේ.

(අ) දෙපාර්තමේන්තුවෙහි තැන්පත් කර ඇති අන්තිම කැමති පත්‍රවලට අදාල තෙස්තමේන්තු නඩු හා බූදල් සම්බන්ධ වෙනත් නෛතික ගැටළු නිරවුල් කර ගැනීම සහ අධිකරණය වෙත යොමුවීමට අවශ්‍ය වන අතර එවැනි අවස්ථාවන්හිදී මහාභාරකාරතැනගේ අභිමතය පරිදි නීතිඥවරුන් තෝරාගෙන ගෙවීම් කිරීම දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය ක්‍රමවේදය බවට පත් වී තිබුණි. මෙම දෙපාර්තමේන්තුවේ ස්වභාවය හා කාර්යභාරය අනුව නිරන්තරයෙන් අධිකරණ කටයුතුවල යෙදීමට අවශ්‍ය වන බැවින් දෙපාර්තමේන්තුව සඳහා නීති නිලධාරීන්ගේ අවශ්‍යතාවය පවතින බව නිරීක්ෂණය විය. එබැවින් වාර්ෂිකව නීතිඥ මණ්ඩලයක් ස්ථාපිත කර අවස්ථාවෝචිතව වඩාත් සුදුසු නීතිඥයින් එම මණ්ඩලයෙන් තෝරාගෙන ඔවුන් හරහා අධිකරණ කටයුතු ඉතා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සිදුකර යුතුව පැවතිය ද එක් එක් අවස්ථාවල එක් එක් නීතිඥවරුන් පත්කර ගනිමින් කටයුතු කර තිබු අතර ඒ අනුව ගාස්තුවල විෂමතාවයන්, ඒ ඒ සිද්ධිය සම්බන්ධයෙන් අදාල නීතිඥවරු දක්වන උනන්දුව වැනි කරුණු හේතුවෙන් එම ගැටලු සම්බන්ධයෙන් ලැබෙන තීරණවලට එය බලපෑමක් වී තිබුණි.

(ආ) අධිකරණ කටයුතු හා සම්බන්ධ වන නීතිඥවරුන්ගේ පැවරුම් පිළිබඳවලිඛිත එකඟතාවයක් නොවූ අතර නීතිඥ ගාස්තු ගෙවීමේදී කලින් තීරණය කරන ලද ගාස්තුවක් හෝ ගාස්තු පරාසයක් තුළ ගෙවීම්කර නොතිබුණු අතර මහාභාරකාරතැනගේ අභිමතය පරිදි ගෙවීම් කර තිබුණි. තවද, අධිකරණ කටයුතු සඳහා වියදම් දැරීම වෙනුවෙන් බූදලයේ වත්කම් උපයෝගී කරගනු ලබන අතර ඇතැම් තෙස්තමේන්තු නඩු කටයුතු සඳහා බූදලයේ වත්කම් භාවිතා කිරීමට බලතල නොමැති අවස්ථාවලදී සහ ඇතැම් බූදල්වල හර ශේෂ පවතින අවස්ථාවලදී වෙනත් බූදල්වලින් වියදම් දැරීම සිදුකරනු ලබන බව නිරීක්ෂණය විය.

උදා -:

(i) මහාභාරකාරතැන භාරයේ වූ ආරක්ෂිත සේප්පුවෙහි තැන්පත් කර ඇති අන්තිම කැමති පත්‍ර 254 ක් විවෘත කිරීම හා සම්බන්ධ නීතිමය කටයුතු සඳහා ඩී. එස්. ඩබ්ලිව්. සමරකෝන් බූදලයෙන් 2018 වර්ෂයේදී රු.2,629,250 ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් එම බූදලයේ වත්කම් අවභාවිතාවීමක් සිදුවී තිබුණි. තවද, මෙම මුදල් සමරකෝන් බූදලය නමින් ලැබිය යුතු මුදලක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ii) එන්.ඩී.ඒ.සිල්වා විජේසිංහ බූදලයේ හර ශේෂයක් පැවතිය දී, 2017 වර්ෂයේදී රු.272,475 ක් ද, 2018 වර්ෂයේදී රු.1,181,500 ක් ද නීති වියදම් දරා තිබුණු අතර මෙය කවර බූදලයට ගෙවිය යුතු වියදමක් ද යන්න සටහන් කර නොතිබුණි.

(iii) ශ්‍රීමා ඉන්ද්‍රානි ද සොයිසා බූදලයෙහි ද 2017 හා 2018 වර්ෂවලදී හර ශේෂ පැවතියදී නීතිඥ ගාස්තු ලෙස පිළිවෙලින් රු.73,220 ක් හා 81,750 ක් ගෙවා තිබුණි.

## 3.3 බූදල් දේපළ කළමනාකරණය

### 3.3.1 බූදල්කරුවන්ගේ අරමුණුවලට අනුව කටයුතු කිරීම

යම්කිසි පුද්ගලයෙකුගේ දේපළට අදාල අද්මිනිස්ත්‍රාසි බලතල මහාභාරකාරතැන වෙත පැවරූ පසු එම දේපළ හිමිකරුගේ අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් අරමුණු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට කටයුතු කළ යුතු වුවත්, අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් අරමුණු ඉටු නොකළ හා අරමුණට පටහැනි කාර්යයන් සිදුකළ අවස්ථා පැවතිණි. ඒ හේතුවෙන් බූදලයේ වත්කම් අවභාවිතා වීමත්, සම්පත් හා කාලය අපතේ යෑමත් හේතුවෙන් බූදල්කරුවන්ගේ අපේක්ෂාවන් ඉටු නොවන බවත් නිරීක්ෂණය විය.

(අ) 2007 අප්‍රේල් 14 දින මියගිය ශ්‍රීමා ඉන්ද්‍රාණි ද සොයිසා වික්‍රමසිංහ මහත්මියගේ 2002 ඔක්තෝබර් 2 දිනැති අංක 4115 දරන අන්තිම කැමති පත්‍රයට අනුව "ඔලිවර් ද සිල්වා භාරය" නමින් භාරයක් ආරම්භ කර දේපළ සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය දක්වා තිබුණි. 2009 සැප්තැම්බර් 20 දින අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය මහාභාරකාරතැන වෙත නිකුත් කොට තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් වසර 10 ක් ගත වුවද අන්තිම කැමති පත්‍රයේ අභිප්‍රායන්ට පටහැනි කාර්යයන් සිදුකිරීම හේතුවෙන් භාරයක් පිහිටුවීම ඇතුලුව බූදල්කරුගේ අරමුණු කිසිවක් සාක්ෂාත්වී නොතිබුණි. මෙම බූදල් දෙපළට අදාල නිරීක්ෂණ පහත පරිදි වේ.

(i) හයිලෙවල් පාර නුගේගොඩ අංක 151/බී දරන නිවස ධර්මවිජය පදනමට ද, එකී නිවසේ ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ ධර්ම විජය පදනම හරහා අවශ්‍යතාවයන් ඇති පවුල් හා ආර්ථික අපහසුතා ඇති ගම්වාසීන්ට ලබාදීම ද බූදල්කාරියගේ අපේක්ෂාව වුවද, 2009 අගෝස්තු මාසයේ දී එවකට දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද නිලධාරිනියකට අත්තනෝමතිකව මහාභාරකාරවරයා විසින් ගිවිසුමකින් හා කුලී ගාස්තුවකින් තොරව පදිංචිය සඳහා නිවස ලබා දී තිබුණි. එම නිලධාරිනිය 2015 ඔක්තෝබර් 16 දින ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර තිබුණ ද එසේ සේවයෙන් නිදහස් කිරීමට ප්‍රථම උක්ත දේපළ නැවත අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. නිවස නැවත ලබා ගැනීම සඳහා 2016 අගෝස්තු 09 දින නුගේගොඩ දිසා

අධිකරණයේ අංක 629/2016/ඉඩම් දරන නඩුව දෙපාර්තමේන්තුව විසින් ගොණුකර තිබුණු අතර 2020 ජනවාරි වනවිටත් නඩු කටයුතු අවසන් වී නොතිබුණි.

(ii) තවද, බූදලය සතු අංක 300-5220 දරන නිසාන් මාච් වර්ගයේ මෝටර් රථය විකුණා ලැබෙන මුදල්, ස්වර්ණාභරණ හා අනෙකුත් ආයෝජනද ධර්මවිජය පදනමට ලබාදෙන ලෙස අන්තිම කැමති පත්‍රයේ සඳහන් කර තිබුණි. ඒ අනුව කිසිදු වත්කමක් පවරා නොතිබුණු අතර වාහනය විකුණා ලද මුදල වූ රු.700,800 ක් 2016 ජනවාරි 01 දින සිට ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කර දෙපාර්තමේන්තුව තුළ රඳවාගෙන තිබුණි.

(iii) අරමුණු ඉටු නොකිරීම හේතුවෙන් ධර්මවිජය පදනම විසින් මහාභාරකාරතැනට විරුද්ධව නඩු පවරා තිබුණු අතර 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා බූදලයේ නඩු කටයුතු වෙනුවෙන් රු.662,825 ක නීති වියදම් දරා තිබුණි. 2019 දෙසැම්බර් 10 දිනට බූදල් ගිණුමේ රු.610,230 ක හර ශේෂයක් නිරීක්ෂණය වූ අතර බූදල් ගිණුමේ හර ශේෂය මත ගෙවීම් කළ නොහැකි බැවින් 2019 වසරේදී රු.50,000 ක නීතිඥ ගාස්තු වෙනත් බූදලයකින් දරා තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට රු.110,250 ක ගෙවිය යුතු නීතිඥ ගාස්තුවක් ද පැවතුණි.

(iv) ඉහත කරුණු හේතුවෙන් මහාභාරකාරතැන සිය දේපළවල භාරකරු ලෙස පත්කිරීමෙන් බූදල්හිමිකාරිය බලාපොරොත්තු වූ අරමුණු කිසිවක් වර්ෂ 10 ක කාලයක් ගතවුවද ඉටුකිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) දොන් සයිමන් විජේවික්‍රම මහතා විසින් 1950 පෙබරවාරි 10 දින ලියන ලද අංක 3911 දරන අන්තිම කැමති පත්‍රයේ 8 වන වගන්තිය ප්‍රකාරව පිළියන්දල නගරයේ ඉදිකිරීමට යෝජිත රෝහලෙහි වාට්ටුවක් ඉදිකිරීමටත් එය ඔහුගේ නැසීගිය මවගේ නමින් නම් කිරීමටත් මහාභාරකාරතැන වෙත පවරා තිබුණු නමුත් එවැනි වාට්ටුවක් පිළියන්දල මූලික රෝහලෙහි ඉදිකිරීම වෙනුවට රු.1,014,275 ක් වටිනා වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම පමණක් සිදුකර ඇති බව රෝහලෙන් ලබාගත් වාර්තා අනුව තහවුරු විය.

(ඇ) 1968 අගෝස්තු 11 දින මියගිය ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මියගේ බූදලයට අයත් දේපළ විකුණා ලැබෙන මුදල් අර්ථලාභීන් වෙත ගෙවීම සඳහා ඇටර්නි බලකරු ලෙස මහා භාරකාරතැන පත්කර තිබූ අතර එසේ දේපළ විකිණීමෙන් ලද මුදලින් රු.8,081,281 ක් එම කාරණයෙන් බැහැරව වෙනත් භාරවල වියදම් දැරීම සඳහා උපයෝගී කර ගෙන තිබුණි.

(ඇ) නුගේගොඩ රේමන්ඩ් පාරේ අංක 49 දරන ස්ථානයෙහි පදිංචිව සිට 1982 අප්‍රේල් 08 දින මියගිය ජී.එස්.ජයසූරිය මහතාගේ බූදලය සම්බන්ධයෙන් පොල්ම:කරු ලෙස 1982 නොවැම්බර් 09 දිනැති අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය මඟින් මහාභාරකාරතැන පත්කර තිබුණි. අන්තිම කැමති පත්‍රයේ අරමුණු ලෙස බෙල්ලන්විල රජමහා විහාරය සහ රත්මලාන සොයිසාරාමය යන විහාරස්ථානවල විදුලි බිල් පියවීම සඳහා මාසිකව රු.500 ක පරිත්‍යාගයක් ලබාදීම, "George Stephen Jayasuriya Memorial Scholarship for Chemistry" සහ "Muhandiram Charles Jayasuriya Memorial Scholarship for Mathematics" යන නම්වලින් ශිෂ්‍යත්ව දෙකක් ආරම්භකර මරදාන ආනන්ද විද්‍යාලයේ සිංහල බෞද්ධ දරුවන් දෙදෙනෙකුට විශ්ව විද්‍යාල අධ්‍යාපනය හමාර වී උපාධිය ලබාගන්නා තෙක් මාසිකව රු.250 බැගින් ගෙවීම හා ශ්‍රී ලංකා පිළිකා සංගමයට සහ රාජගිරියේ වික්ටෝරියා නිවාසයේ සිටින සුවකළ නොහැකි රෝගීන් සඳහා මාසික ආධාරමුදලක් ගෙවීම දක්වා තිබුණි.

1950 මැයි 14 දින හා අංක 1531 දරන ඔප්පුව මඟින් ජයසූරිය මහතාගේ නැසීගිය පළමු බිරිඳට හිමිවී තිබූ රත්මලාන ලේඩි කැතරින් වත්ත නැමැති ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණය කොමිෂන් සභාවට පවරා ගෙන තිබූ අතර ඉඩමේ වන්දි හිමිකාරීත්වය සඳහා මහාභාරකාරවරයා විසින් ඉල්ලුම්කර තිබුණි. කලත්‍රයා දෙවන විවාහයකට එළඹියේ නම් දේපළ සම්බන්ධයෙන් කිසිඳු අයිතියක් කලත්‍රයාට හිමි නොවන බව 1531 දරන ඔප්පුවේ පැහැදිලිව දක්වා තිබුණි. ජයසූරිය මහතා දෙවන විවාහයකට එළඹ තිබූ බැවින් ඉඩම සම්බන්ධයෙන් හිමිකමක් නොතිබියදී, ඉඩමේ වන්දි හිමිකාරීත්වය සඳහා ඉල්ලුම් කිරීම හේතුවෙන් 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා නීතිඥ ගාස්තු වශයෙන් රු.2,962,430 ක් දැරීමට සිදු වී තිබුණි. තවද, 2019 ඔක්තෝබර් 23 දින ලද අංක 522/00/විශේෂ දරන නඩුවේ නියෝගය ප්‍රකාරව එකී දේපළට හිමි වන්දි මුදල් ලබා ගැනීමේ නීත්‍යානුකූල හිමිකමක් මහාභාරකාරවරයාට නොමැති බවට තීන්දු කර තිබුණි. එබැවින්, හිමිකමක් නොමැති දේපළක් වෙනුවෙන් අනවශ්‍ය ලෙස කාලය සහ බූදලයේ ආයෝජන ආදායම් යෙදවීම හේතුවෙන් 2010 වර්ෂයේ සිට ඉහතින් සඳහන් කරන ලද බූදලයේ කිසිදු අරමුණක් ඉටුකිරීමට නොහැකිවී තිබුණි.

(ඉ) වීරසිංහ අබේනායක බූදලයට අයත් බස්නාහිර ගිරුවාපත්තුවේ පොල්මොටේ ගම පිහිටි මෝදරමුණේයාය සහ කදුරුගස්වැකඩ නැමැති හෙක්ටයාර් 31.2124 ක් වූ ඒකාබද්ධ ඉඩමෙන් හෙක්ටයාර් 31.0287 ක් රජයට පවරාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් 2012 මාර්තු 06 දින රු.16,500,000 ක මුදලක් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණි. එම වන්දි මුදල වීරසිංහ අබේනායක භාර අරමුදල නමින් හඳුනා නොගෙන පොදු ආයෝජන ගිණුමක තැන්පත් කිරීම නිසා 2012 වර්ෂයේ සිට 2015 මාර්තු දක්වා කාලය තුළ ලද පොළී මුදල් රු.4,516,050 ක් වීරසිංහ අබේනායක භාර අරමුදලට අහිමි වී තිබුණි.

භාරයට අහිමි වූ මුදල් පොදු ආයෝජන ගිණුමෙන් අයකර භාර අරමුණු ඉටුකිරීමට හැකිවන පරිදි භාරය නමින් තැන්පත් කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණු අතර එම ලැබිය යුතු පොළිය ගිණුම්ගත කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඊ) හැරී හපුගොඩ මහතාගේ අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව සෑම වසරකදීම බූදලයේ ආදායමින් $1/_5$ ක් ඉතිරි කළ යුතු බවත් එම ඉතිරිය රු.100,000 වූ විට එය ශිෂ්‍යාධාර පිරිනැමීමට හා ආපදා තත්වයන්හිදී සහන සැලසීමට රැස් කර තැබිය යුතු බවත් දක්වා තිබුණි. එසේ වුවත් බූදලයේ එම අරමුණු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඉතිරි කර නොතිබුණි. 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 5 ක කාලයේදී රු.24,865,439 ක ආදායම් උපයා තිබුණු අතර එයින් රු.4,973,088 ක් ඉතිරිකර ආයෝජනය කළ යුතු වුවත් එසේ ඉතිරි කර නොතිබුණි. විස්තර ඇමුණුම 04 හි දැක්වේ.

(උ) නිහාල් පීරිස් මහතාගේ බූදලයට අයත් රත්මලාන දෙවන පටුමග අංක 57 හි පිහිටි නිවස 2007 වර්ෂයේදී සුළු අලුත්වැඩියාවක් සිදුකර බදු දීමට හැකියාව ඇති බව තීරණය කර තිබුණද එසේ සිදුනොකිරීම හේතුවෙන් 2013 වර්ෂයේදී අළුත්වැඩියා ඇස්තමේන්තුව රු.4,202,772 ක් වී තිබුණි. බූදලය සතුව එවැනි මුදලක් නොවුයෙන් 2015 වර්ෂයේදී රු.22,500,000කට තක්සේරු කර විකිණීම සඳහා 2016 වර්ෂයේ දී අධිකරණ අවසරය ඉල්ලා තිබුණි. නැවතත් 2018 වර්ෂයේ දී රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් රු.2,623,800 ක අළුත්වැඩියා ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණද අළුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණි. අළුත්වැඩියා කර ආදායම් ඉපයීම හෝ අධිකරණ අවසරය ලබාගෙන විකිණීම යන අවස්ථා දෙකන් නිශ්චිත තීරණයකට එළඹීමට නොහැකි වීම හේතුවෙන් 2019 වර්ෂය දක්වාම දේපළ නිෂ්කාර්යව පැවතුණි. එබැවින් බූදලය සුදුසු පරිදි ප්‍රවර්ධනය කර අර්ථලාභීන්ගේ සුභසිද්ධියට යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) නානායක්කාර රජවාසල අප්පුහාමිලාගේ දොන් ආතර් සිල්වා විජේසිංහ සිරිවර්ධන නම්වූ දකුණු කළුතර රිච්මන්ඩ් මන්දිරයේ සිටි පඩිකාර මුදලිතුමා තම අවසන් කැමති පත්‍රයෙන් මහාභාරකාරවරයා තම බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත්කොට 1947 ජූලි 08 දින මිය ගොස් තිබූ අතර 1947 ජූලි 30 දින සිට බූදලයේ භාරකාරත්වය මහාභාරකාරවරයා සතු වී තිබුණි.

අසරණ ලාංකික පිරිමි ළමුන් සඳහා "සිල්වා විජේසිංහ ජාතික ළමා නිවාසය'' නමින් වූ නිවහනක් ඇති කර අධ්‍යාපනය මඟින් ලබන පුහුණුව තුළින් නියම පුරවැසියන් වීමට ළමයින්ගේ ජීවිත හැඩගැස්වීම හා එය එංගලන්තයේ ආචාර්ය බර්නාඩෝන්ගේ නිවස ආදර්ශයට ගෙන දේශීය අවශ්‍යතාවයන්ට සරිලන අයුරින් පිහිටුවා පවත්වාගෙන යාම බූදල්කරුගේ ප්‍රධාන අරමුණ වී තිබුණි. එම අරමුණු ඉටුකිරීම සඳහා අන්තිම කැමති

පත්‍රයෙන් පවරා තිබූ දේපළ වශයෙන් රිච්මන්ඩ් මන්දිරය පිහිටි රබර් හා පොල් වගාව සහිත අක්කර 42 ක භූමියේ ආදායම හා ගම්පහ දිස්ත්‍රික්කයේ හේනේගම පිහිටි "ඉරහඳයාව" නම් වූ අක්කර 81 ක පොල් වත්තෙන් ලැබෙන ආදායමද යොදවා ගතයුතු බව දක්වා තිබුණි.

(i) "සිල්වා විජේසිංහ ජාතික ළමා නිවාසය" යන නමින් ළමා නිවාසයක් පිහිටුවා තිබුණු අතර වර්තමානයේ දී එහි පිරිමි ළමුන් 8 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය. නේවාසිකාගාරය අබලන් වීම හා බිත්ති ඉරිතැලී යෑම හේතුවෙන් 2019 සැප්තැම්බර් මාසයේ සිට තාවකාලිකව භෝජන ශාලාව ආසන්නයේ පිහිටි කාමර කිහිපයක ළමුන්ට නවාතැන් පහසුකම් සලසා තිබුණි. මෙම නේවාසිකාගාරය 2014 වර්ෂයේදී ඉදිකර තිබූ අතර වහලය සඳහා ශක්තිමත්භාවයෙන් අඩු දැව (පිනි ජම්බු ලී) යොදාගෙන තිබූ බව නිරීක්ෂණය වූ අතර 2019 දෙසැම්බර් වනවිටත් ඔවුන්ගේ ශිෂ්‍ය නේවාසිකාගාරය පිළිසකර කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. එබැවින් බුදල්කරු බලාපොරොත්තු වූ ප්‍රධාන අරමුණ ප්‍රමාණවත් පරිදි ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ii) මන්දිරයේ වහලය අබලන් වීම හේතුවෙන් වර්ෂ 100 කට අධික ඉතිහාසයක් සහිත පෞරාණික වැදගත්කමකින් හෙබි මෙම මන්දිරයේ බොහෝ ස්ථාන ගරා වැටෙන තත්ත්වයක්ද, පියගැටපෙල සහ මන්දිරයේ නැරඹුම් මැදිරිය ගමන් කිරීම සඳහා අනාරක්ෂිත බවද, එනයින් ඇතැම් ස්ථාන නැරඹීම් කටයුතු සඳහා සීමාකර ඇතිබවද නිරීක්ෂණය වූ අතර කඩිනමින් පිළිසකර කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය. මෙම මන්දිරය සඳහා පසුගිය වර්ෂ 10 ක කාලය තුළ කිසිදු අලුත්වැඩියා කිරීමක් සිදු කර නොතිබුණි.








(iii) අධ්‍යාපන ඇමතිතුමා විසින් නම්කරනු ලබන සභාපතිවරයෙකු, සේවය කිරීමට කැමැත්තක් දක්වන්නේ නම් ශාන්ත ජෝෂප් විද්‍යාලයේ ප්‍රධාන දේව ගැතිතුමන්, කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ප්‍රධාන නිලධාරියා, ලංකාවේ මහාභාරකරු, කළුතර මීසමේ රෝමානු කතෝලික මීසම් පියතුමා හා ලංකා විශ්ව විද්‍යාලයේ උපකුලපති වරයා යන අයගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් මඟින් නිවාසය පාලනය කල යුතු බව දක්වා තිබුණද, එසේ කටයුතු කර නොතිබුණි.

(iv) එන්.ඩී.ඒ. සිල්වා විජේසිංහ බූදලයට අදාල අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් පහත සඳහන් සෙසු අරමුණු පසුගිය වර්ෂ 5 ක කාලය තුළ දී ඉටුකර නොතිබුණි.

- මුදලිතුමාගේ මරණයෙන් පසු එතුමාගේ ආත්මයේ සැනසීම පිණිස දිනකට එක බැගින් පූජාවන් පැවැත්වීම වෙනුවෙන් රු.1000 ක මුදලක් මහනුවර රෝමානු කතෝලික අගරදගුරුතුමන් වෙත ලබාදීම.
- මුදලිතුමාගේ ආත්මයේ සැනසීම සඳහා දිනපතා සුළු පූජාව පැවැත්වීම වෙනුවෙන් තමන්ගේ වතුයායේ ආදායමෙන් රු.75 ක මුදලක් කොළඹ ශාන්ත ජෝශප් විදුහලේ ප්‍රධාන දේවගැතිතුමන්ට ලබාදීම.
- තම දෙමාපියන්ගේ ආත්මයෙහි සැනසීම සඳහා මහ පූජාවන් පැවැත්වීමට වාර්ෂිකව (මැයි 10 හා නොවැම්බර් 17 ) රු 100/- නොඉක්මවන මුදලක් කොළඹ ශාන්ත ජෝසප් විදුහලේ ප්‍රධාන දේවගැතිතුමන්ට ලබාදීම.
- ඉතිරි මුදලක් වේ නම් ලිට්ල් සිස්ටර්ස් ඔෆ්ද පුවර් විසින් පවත්වාගෙන යනු ලබන කොළඹ වැඩිහිටි නිවාසයේ නිවැසියන්ගේ ආහාරපාන සඳහා ලබාදීම.
- කොළඹ ශාන්ත ජෝසප් විදුහලේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා ත්‍යාග 2 ක් තමන් සහ තම දෙමාපියන්ගේ නමින් ලබාදීම සඳහා රු.100 ක මුදලක් ලබාදීම.

ඉහත සඳහන් අරමුණුවලට අදාලව පරිත්‍යාග මුදල් වර්තමානයට ගැළපෙන ආකාරයට සංශෝධනයකර අදාල පාර්ශවයන් වෙත ගෙවීමට දෙපාර්තමේන්තුවේ කළමනාකරණය විසින් අවධානය යොමුකර නොතිබුණි.

### 3.3.2 දේපළවල ආරක්ෂාව තහවුරු කිරීම

(අ) මහාභාරකාරතැන දේපළවල භාරකරු ලෙස පත්කර ඇති අවස්ථාවන්හිදී එම දේපළවලට අදාල චංචල දේපළවල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මහා භාරකාරතැනගේ වගකීම වේ. ඒ අනුව ඇතැම් පුද්ගලයින්ට අදාල භාණ්ඩ දෙපාර්තමේන්තු ගොඩනැඟිල්ලෙහි පවතින සේප්පුවක තැන්පත් කර ඇති බව දක්නට ලැබුණද, එම භාණ්ඩ අතරින් බොහොමයක් කවර පුද්ගලයින්ට/ බූදලයට අදාලද යන්න හඳුනාගත හැකි පරිදි ලේඛනගත කර තැන්පත් කර නොතිබීම හේතුවෙන්

එම වත්කම්වල ආරක්ෂක භාරකරු වශයෙන් මහා භාරකාරතැනගේ වගකීම ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. තවද, සේප්පුව තුළ පැවති විවිධ වර්ගයේ තැන්පතු සහතික, බඳු ඔප්පු හා වෙනත් ලිපි සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කර එම ලිපි කටයුතු නිරවුල් කිරීම සඳහා කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) එන්.ඩී.ඒ.සිල්වා විජේසිංහ මුදලිතුමාගේ අන්තිම කැමති පත්‍රයෙහි පෞරාණික වටිනාකමකින් යුත් කෞතුක භාණ්ඩ ලැයිස්තුවක් දක්වා තිබුණු අතර එම කෞතුකභාණ්ඩ එතුමාගේ මන්දිරයෙහි තැන්පත්කර සංරක්ෂණය කළයුතු බව සඳහන් කර තිබුණි. (භාණ්ඩ ලැයිස්තුව ඇමුණුම 02 හි දැක්වේ.) එහෙත් එම කෞතුක භාණ්ඩ අතරින් කෞතුක භාණ්ඩ කිහිපයක් පමණක් දෙපාර්තමේන්තුවේ සේප්පුවක තබා ඇති බව නිරීක්ෂණය වු අතර අනෙකුත් කෞතුක භාණ්ඩ පවතින ස්ථානය පිළිබඳව දෙපාර්තමේන්තුව සතුව වාර්තා නොතිබුණි. එම සේප්පුවෙහි තැන්පත් කර තිබූ බාපනයද අබලන් වී තිබුණු අතර ඓතිහාසික වටිනාකමක් ඇති භාණ්ඩ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. ඒ අනුව බුදල් හිමිකරු සිය දේපළ මහාභාරකාරතැන වෙත පැවරීමෙන් එම අරමුණ ඉටු වී නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) ශ්‍රීමා ඉන්ද්‍රානි ද සොයිසා මහත්මියගේඅන්තිම කැමති පත්‍රය ප්‍රකාරව නුගේගොඩ ලංකා බැංකු අධිශ්‍රේණි ශාඛාවේ ලොකර් අංක 738 හි තැන්පත් කර තිබූ ස්වර්ණාභරණ 2007 සැප්තැම්බර් 17 දින දෙපාර්තමේන්තුවේ නීති හා විමර්ෂණ නිලධාරී විසින් පරීක්ෂා කර ලැයිස්තුගත කර තිබුණු අතර එම ලැයිස්තුවේ සඳහන් ස්වර්ණාභරණ හා අන්තිම කැමති පත්‍රයේ සඳහන් ස්වර්ණාභරණ වර්ග, ප්‍රමාණයන් හා ලෝහ වර්ගයන්අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

| අන්තිම කැමති පත්‍රය අනුව දේපළ ලැයිස්තුව | භෞතිකව පරීක්ෂා කර සකස් කළ ලේඛනය අනුව දේපළ ලැයිස්තුව |
|---|---|
| Two gold chains & gold bangle | රත්‍රං පාට දම්වැලෙන් යුත් සුදුපාට ගල් අල්ලන ලද රිදී පාට මාල 01 |
| Diamond necklace, eardrops, earstudes and diamond pendant | සුදුපාට ගල් අල්ලන ලද රිදීපාට එල්ලෙන කරාබු ජෝඩු 01 |
| Ceylon stone necklace and earstuds | රත්‍රං පාට, දුඹුරු පාට හා නිල්පාට ගල් අල්ලන ලද කරාබු ජෝඩු 01 |
| Coral pendant and earstuds | පවුමක් බරති රත්‍රං පෙන්ඩන්ට් 01 |
| | හිස් ආභරණ පෙට්ටි 01 |

මෙම වෙනස්කම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව අවධානය යොමුකර නොතිබුණු අතර ඉහත අංක 738 දරන බැංකු ලොකරය විවෘත කිරීම හා භාණ්ඩ ලැයිස්තුව ලබා ගැනීම සඳහා බැංකු නිලධාරීන් දෙදෙනෙක්, ධර්මවිජය පදනමේ නිලධාරීන් දෙදෙනෙක් හා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ සංවර්ධන සහකාර (නීති හා විමර්ෂණ) හා අභ්‍යන්තර විගණන නිලධාරී සහභාගී වූ බව දක්වා ඇතත් භාණ්ඩ ලැයිස්තුව ඉදිරිපත් කර ඇත්තේ නීති හා විමර්ෂණ නිලධාරියාගේ අත්සනින් පමණි. එබැවින් භාණ්ඩ පරීක්ෂාකර භාර ගැනීමේදී විනිවිදභාවය ආරක්ෂා වන පරිදි එම කාර්යය සිදුකිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) නෝර්ටන් බ්‍රිජ්, තලවකැලේ පාර, නෝර්ටන් ෆාම් හී පදිංචිව සිටි 1989 ඔක්තෝබර් 19 දින නැසීගිය අයි. ඩබ්ලිව්. සී විජේරත්න මහතාගේ 1982 අප්‍රේල් 21 දිනැති අංක 197 දරන අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව තම බූදලය සඳහා ආරක්ෂක භාරකරු වශයෙන් මහාභාරකාරතැන නම් කර තිබුණි. 1990 ජූනි 14 දින සිට අන්තිම කැමති පත්‍රය අනුව අරමුණු ඉටු කිරීමේ වගකීම මහාභාරකාරතැන වෙත පැවරී තිබුණු අතර අන්තිම කැමති පත්‍රයේ 6 ඡේදය ප්‍රකාරව නෝර්ටන් බ්‍රිජ් හි පිහිටි නිවසෙහි වැඩිහිටි නිවාසයක් හෝ අඳගොළු බිහිරි පාසලක් පැවැත්වීම අරමුණ වී තිබුණි. මේ අනුව මහාභාරකාරතැන විසින් 1993 දෙසැම්බර් 07 දින අක්කර 5 ක් පමණ වූ ඉඩම හා එහි පිහිටි නිවස වැඩිහිටි නිවාසයක් සඳහා ගිනිගත්හේන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත භාරදී තිබුණි. ගිනිගත්හේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම නිවසෙහි, ගිනිගත්හේන ප්‍රාදේශීය ලේකම් විසින් සභාපති ධූරය දරන භාරකාර මණ්ඩලයක් විසින් පාලනය වන චන්ද්‍රා විජේරත්න අනුස්මරණ වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථානය නමින් වැඩිහිටි නිවාසයක් 1994 මැයි 25 දින ආරම්භ කර තිබුණි.

(i) බූදලයට අයත් නිශ්චල දේපළ, වෙනත් පාර්ශවයක් වෙත ලබාදීමේදි නිවස භාරදීම හා නඩත්තු කිරීම යනාදී කරුණු පිළිබඳව විධිමත් පරිදි එකඟතාවයක් ඇතිකර ගැනීම සඳහා ගිවිසුමකට එළඹීය යුතු වුවත් 2019 දෙසැම්බර් 10 දින වනවිට වර්ෂ 25 ක් ගත වී තිබුණද, විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) නිවාසයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව පවසමින් අවස්ථා 3කදී ගොඩනැඟිලි ඉදිකර තිබුණ ද, ඒ සඳහා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණු බැවින් එය අනවසර ඉදිකිරීමක් බව නිරීක්ෂණය විය.

(iii) 2019 පෙබරවාරි 25 හා 26 දිනයන්හි දී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව අනුව මෙම බූදලයට අයත් අක්කර 5 ක පමණ ඉඩමෙන් කිසිඳු ප්‍රයෝජනයක් නොගන්නා බවත්, පෞද්ගලික ඉඩම්වලට මායිම් වූ දෙපැත්තෙහි ආරක්ෂිත වැට ඉදිකර නොමැතිබවත්, දෙපාර්තමේන්තුවේ

අයිතිය ප්‍රදර්ශනය වන දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කර නොමැති බවත් නිරීක්ෂණයකර තිබුණද, ඒ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂාවක් සිදුකර අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදුකර නොතිබුණි. තවද, පාලක මණ්ඩලය අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් හා ගිණුම් වාර්තා ලබාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.3.3 අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ලද පසු ක්‍රියාත්මක වීම

බොහෝ බූදල් හිමිකරුවන් විසින් ආර්ථික, සමාජීය හා ආගමික වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකිරීමේ අරමුණින් බොහෝමයක් බූදල් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති අතර එවැනි අවස්ථාවන්හිදී අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ලද වහාම අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා යොමුවීම තුලින් බූදල්කරුට සාධාරණයක් ඉටුවනවා මෙන්ම ආර්ථික හා සමාජීය ප්‍රගමනයට දායකවීමක්ද සිදුවනු ඇත. එහෙත් අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ලද පසු මහාභාරකාරතැන විසින් සිය වගකීම අවබෝධකර ගනිමින් කාර්යක්ෂමව අරමුණු ඉටුකිරීමට යොමු නොවීම හේතුවෙන් බූදල්කරුවන්ගේ අරමුණු ඉටුනොවීමත් එනයින් ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ අහිමිවීමත් නිරීක්ෂණය විය.

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ වැල්ලවත්ත ප්‍රදේශයෙහි පදිංචිව සිට 1999 නොවැම්බර් 28 දින මියගිය සී. ඊ. වනිගසූරිය මහතාගේ දේපළ විකුණා ලැබෙන මුදල් “සිසිල් වනිගසූරිය” නමින් වූ භාරයක තැන්පත් කිරීම සඳහා මහාභාරකාරතැන වෙත 2005 නොවැම්බර් 10 දින අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී තිබුණි. එහෙත් 2019 දෙසැම්බර් වන විට වර්ෂ 14 ක කාලයක් ගත වී තිබුණද, පහත සඳහන් ඉඩම් හා ගොඩනැඟිලි විකුණා බූදල්කරුගේ අරමුණු විශ්වාසනීයව හා කාර්යක්ෂමව ඉටුකිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද, එම ඉඩම් හඳුනාගෙන මහාභාරකාරතැනගේ අයිතිය තහවුරුවන පරිදි ආරක්ෂා කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) වැල්ලවත්ත දුම්රිය පොල පටුමගේ වරිපනම් අංක 26 දරන ස්ථානයේ පිහිටි ඉඩමේ 1/3 කොටසින් රජයට පවරා ගෙන ඉතිරි වූ කොටස

(ii) අක්කර 4 ක් පමණ වූ කොලොන්නාව නගර සභා සීමාව තුල පිහිටි සේදවත්ත වරිපනම් අංක 220,220/1 සහ 220/2 දරන දේපල සහ ගොඩනැගිලි

(iii) කඩවත මිරිස්වත්තේ ඌරලිංකනත්ත ඉඩමේ නොවිකුණා ඉතිරි වූ අක්කර 1 රූඩ් 3 පර්චස් 6.3 ක ඉඩම්

(iv) හික්කඩුව රම්මුද්ද පිහිටි අක්කර 7, රූඩ් 3, පර්චස් 8 ක් වූ පහත් බිමෙන් නොබෙදූ ¼ පංගුව

(v) බොරකඩුන්න පිහිටි අක්කර 4 ක ඉඩමෙන් නොබෙදූ 1/3 පංගුව

(vi) බටකච්චිය පිහිටි අඩි 50 ක් සහ අඩි 15 ක් විශාල ඉඩම් කැබැල්ලෙන් නොබෙදූ 1/3 කොටස

(vii) පිඹුරු අංක 4070 හි සඳහන් කැබලි අංක 3 දරන පානදුර පිහිටි එළිවිල්ලා නම් රූඩ් 3 පර්චස් 80 ක් විශාල කුඹුරු ඉඩමෙන් 1/3 කොටස

(ආ) ඩී. එස්. ඩබ්ලිව් සමරකෝන් බූදලයට අයත් පිළියන්දල පිහිටි රෙජිඩේල් වත්ත ඉඩමෙන් රජයට පවරාගත් අක්කර 1 රූඩ් 2 පර්චස් 18.46 ක් 2009 ජුනි 02 දින අවසතු කර 2011 මාර්තු 23 දින දෙපාර්තමේන්තුව වෙත නැවත භාර දී තිබුණි. 2019 දෙසැම්බර් වනවිට වර්ෂ 08 ක කාලයක් ගතවී තිබුණද එම ඉඩම විකිණීමට කටයුතු කර නොතිබුණි. තවද, එම බූදලයටම අයත් පිළියන්දල දෙල්ගහවත්ත අක්කර 6 පර්චස් 35.8 ක් වූ ඉඩමේ අයිතිය මහාභාරකාර දෙපාර්තමේන්තුව සතු බව 1965 ජුලි 02 දින අධිකරණය තීරණය කර තිබුණද එම ඉඩම විකුණා බූදලයෙහි අරමුණු සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කොළඹ 7 බාන්ස් පෙදෙසෙහි පදිංචිව සිට 1965 ආගෝස්තු 10 දින මිය ගිය ජොහානා ඩයස් ජයවීර අබේසේකර මහත්මිය විසින් 1965 අගෝස්තු 06 දින ලියන ලද අංක 92 දරන අන්තිම කැමති පත්‍රයේ අරමුණු ඉටුකිරීම සඳහා දේපළ විකුණා මුදල් ලබාගන්නා ලෙස මහා භාරකාරතැන වෙත 1968 මාර්තු 31 දින අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී තිබුණි.

(i) එම දේපළ අතරින් ඇල්පිටිය, කුරුඳුගහ හැතැප්ම බටපොල පිහිටි අංක 23 දරන කඩකාමරය හා ඇල්පිටිය, කුරුඳුගහ හැතැප්ම බටපොල පාර අංක 33/1 දරන ඉඩම් කොටස වසර 20කට වැඩි කාලයක සිට ගිවිසුම්වලින් තොරව බදු දී තිබුණි. 2013 හා 2015 වර්ෂවලදී රු.1,100,000 ක් හා රු.2,300,000ක් ලෙස තක්සේරු කරන ලද මෙම කඩ කාමරය හා ඉඩම දැනට බුක්ති විඳිනු ලබන බදුකරුවන් විසින් තක්සේරු වටිනාකමට මිලදී ගැනීමට එකඟ වූ බව සඳහන් කළ ද ඒ සඳහා ලිඛිත එකඟතාවයක් නොවීය. තවද, කඩකාමරය වෙනුවෙන් 2018 මැයි දක්වා රු.227,380 ක්ද, ඉඩම සඳහා 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.143,400 ක්ද වශයෙන් බදු කුලී අයවිය යුතු බව ගණනය කර තිබුණද, එම මුදල් ද ඇතුළුව 2019 වර්ෂය දක්වා අයවිය යුතු බදු කුලී අයකර ගෙන නොතිබුණි.

(ii) මෙම බූදලයට අයත් නුගේගොඩ කන්ද අද්දර කට්ටිය නොහොත් ඉහල කන්ද ඉඩම සම්බන්ධයෙන් පැවති බෙදුම් නඩුව සඳහා 2013 අගෝස්තු 26 දින ලද අවසන් තීන්දුව ප්‍රකාරව රූඩ් 01 පර්චස් 26.6 ක් මහා භාරකාරවරයාට හිමිව තිබුණි. වසර 6 ක කාලයක් ගතවී තිබුණද, මෙම ඉඩම සංවර්ධනය කිරීමට හෝ තක්සේරු වාර්තා ලබාගෙන විකිණීමට හෝ කටයුතුකර නොතිබුණි.

(ඈ) ජෝන් වීරසිංහ හා බේබි ඇන්ජී අබේනායකයුවලගේ 1956 මැයි 09 දිනැති අංක 19047 දරන සමගි අන්තිම කැමති පත්‍රය සහ 1960 නොවැම්බර් 23 දිනැති අංක 22712 දරන කොඩිසිල් පත්‍රය සම්බන්ධයෙන් මාතර දිසා අධිකරණයේ පැවති අංක 5466 දරන බූදල් නඩුවට අදාලව එම දෙපලගේ දේපළ පාලනය කිරීම සඳහා 1982 මාර්තු 30 දින මහාභාරකාරවරයාට අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් නිකුත් කොට තිබුණි. එම දේපළවලින් අවුරුදුපතා ලැබෙන ආදායමෙන් අරමුදලක් පිහිටුවා අනුරාධපුරයේ රුවන්වැලි සෑයේ වැඩිදියුණුව සඳහා එහි චෛත්‍ය වර්ධන සමිතියටත්, දඹදිව සිද්ධස්ථානයන්ගේ දියුණුව සඳහා ඉන්දියාවේ මහාබෝධි සමාගමටත් සම සේ බෙදා යවන ලෙස අන්තිම කැමති පත්‍රයේ අරමුණු ලෙස දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත පරිදි වේ.

(i.) 1982 වර්ෂයේ දී අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ලැබී තිබුණද, භාර ඔප්පුවක් සකස් කිරීම සඳහා 2009 ජුනි 23 දින දක්වා වර්ෂ 27 ක් ද බූදල්කරුවන්ගේ අරමුණු ඉටුකිරීම ආරම්භ කිරීමට 2011 වර්ෂය දක්වා වසර 29 ක්ද ගත වී තිබුණි.

(ii.) ඉහත බූදලයට අයත් මාතර ගබඩා වීදියේ පුංචිපතහෙවත්ත 'බී' අක්ෂරය දරන කැබැල්ලෙන් බෙදූ අංක 03 දරන පර්චස් 32 ක් විශාල ඉඩම හා ගොඩනැඟිල්ල 2013 වර්ෂය දක්වා ඵලදායී අයුරින් කළමනාකරණය කර නොතිබුණු අතර 2013 පෙබරවාරි 05 දින අංක 312 දරන බදු ගිවිසුම මත Y.T.K. හරිස්චන්ද්‍ර නැමැත්තෙකුට මාසිකව රු.8000 කට බදු දී තිබුණි. උක්ත බදු ගිවිසුම 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. මෙම දේපළ විකිණීම සඳහා නඩු අංක 97/16 යටතේ 2016 සැප්තැම්බර් 29 දින කොළඹ දිසා අධිකරණයේ දිසා විනිසුරුවරයාගේ අවසරය ලබාගෙන තිබුණද දේපළ විකුණා අරමුදලට බැර කිරීම වෙනුවට විධිමත් බදු ගිවිසුමකට එළඹීමෙන් තොරවඉහත බදුකරුටම මාසිකව රු10,000 ක මුදලකට බදු දී තිබුණි.

(ඉ) 1968 අගෝස්තු 11 දින සිංගප්පූරුවේදී මියගිය ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මියගේ ශ්‍රී ලංකාවේ පැවති නිශ්චල හා චංචල දේපළ විකුණා ලැබෙන මුදල් උරුමකරුවන්ට/ අර්ථලාභීන්ට ලබාදීම සඳහා ඇටර්නි බලකරු ලෙස 1975 වර්ෂයේදී සිංගප්පූරු මහා භාරකාරවරයා විසින් ශ්‍රී ලංකා මහා භාරකාරවරයා පත්කර තිබුණි.

(i) කොළඹ 05, හැව්ලොක් පාර, අංක 19 දරන ස්ථානයෙහි පිහිටි රූඩ් 01 පර්චස් 3.13 ක වර්ග ප්‍රමාණයකින් යුත් ඉඩම හා ගොඩනැගිල්ල රු.69,066,000 ක මුදලකට විකුණා තිබුණු අතර රජයේ හා දෙපාර්තමේන්තුවේ වියදම් අඩුකළ පසු රු.64,645,776 ක් උරුමකරුවන්/අර්ථලාභීන් 8 දෙනෙකු අතර බෙදාහැරීමට නියමිතව පැවතුණි. මෙම දේපළෙහි ඇටර්නි බලකරු ලෙස මහා භාරකාරවරයා පත්කර ඇති අවස්ථාවේ එනම් 1975 වර්ෂයේදී දේපළ උරුමකරුවන් 08

දෙනෙකු පමණක් සිටියද දීර්ඝ ලෙස කල් ගත වීම මත දැනට හඳුනාගත් පරිදි උරුමකරුවන් 46 දෙනෙකු දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව රු.35,880,064 ක මුදලක් උරුමකරුවන්/අර්ථලාභීන් 30 දෙනෙකුට ලබාදී තිබුණි. තවදුරටත් අර්ථලාභීන් 16 දෙනෙකු සඳහා රු.28,765,712 ක් ගෙවිය යුතුව තිබුණු අතර දේපළ විකුණා වර්ෂ 8කට අධික කාලයක් ගත වී තිබුණද පිළිගත හැකි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) නඩු අංක 624/ටී හා 2008 ඔක්තෝබර් 6 දිනැති කොළඹ දිසා අධිකරණයේ තීන්දුව ප්‍රකාරව දේපළ විකිණීමෙන් ලැබෙන මුදල සහ ඊට එකතුවන පොළිය මියගිය අයගේ උරුමකරුවන්ට බෙදා හැරිය යුතු වේ. එහෙත්, දේපළ විකිණීමෙන් ලද රු.24,531,570 ක් අර්ථලාභීන් 16 ක් අතර 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී බෙදාහැරීමේදී, එම මුදල් නිදහස් කරන තෙක් ඵලදායී ආයෝජන මාර්ගවල නොයෙදීම හේතුවෙන් අර්ථලාභීන්ට හිමි විය යුතුව තිබූ පොළී මුදල් අහිමි වී තිබුණි.

(iii) මෙම බූදලය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇටර්නි බලපත්‍රය ලැබී 2019 වර්ෂය වන විට වර්ෂ 44 ක් ගත වී තිබුණද, කොළඹ 5 හැව්ලොක් පාර, ක්ලාසන් පෙදෙස අංක 12 දරන රූඩ් 01 පර්චස් 5.62 ක් වූ නිවස සහිත ඉඩම, එම නිවසෙහි පදිංචිකරුවන් විසින් එම දේපළ විකිණීමට විරුද්ධව ගොනු කළ පෙත්සමක් හේතුවෙන් එම දේපළ විකුණා අර්ථලාභීන් වෙත මුදල් ගෙවා අවසන් කිරීමට ශ්‍රීලංකාවේ මහාභාරකාරවරයා අපොහොසත් වී තිබුණි. නිසි කාලයේදී නිවැරදි තීරණ නොගැනීමත්, ඉටුකළ යුතු කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සැලසුම් සකස් නොකිරීමත්, පසු විපරම් කටයුතු ප්‍රමාණවත් නොවීමත් හේතුවෙන් දේපළ හිමියන්ගේ අරමුණු ඉටු නොවන බව නිරීක්ෂණය විය.

(ඊ) උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර නගරයේ පදිංචිව සිටි 1998 පෙබරවාරි 22 දින මිය ගිය ආර්. එල්. එච්. චන්ද්‍රසේකර යන අයගේ 1993 සැප්තැම්බර් 09 දිනැති අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව දේපළ පාලනය සම්බන්ධයෙන් 2003 ජුනි 04 දින සීමිත ප්‍රොබේට් බලපත්‍රයක් මහා භාරකාරතැන වෙත ප්‍රදානය කර තිබුණි.

(i) බලපත්‍රය ලැබී වසර 16 ක් ගත වුවද, මෙම බූදලයට අයත් ඉඩම් ප්‍රමාණය මැණීම් කර මායිම් වෙන් කර දේපළ ආරක්ෂා කිරීමටත්, අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් අරමුණු ඉටු කිරීමටත් කටයුතු කර නොතිබුණි. මෙම බූදලය සම්බන්ධයෙන් වූ බූදල් නඩුවක් හේතුවෙන් මෙලෙස ප්‍රමාදයන් සිදු වූ බව දෙපාර්තමේන්තුව විසින් සඳහන් කළ අතර 2019 සැප්තැම්බර් 30 දින අදාල

නඩුවෙහි තීන්දුව ප්‍රකාශකර තිබුණද, ඒ අනුව කටයුතු නොකර අභියාචනා ගොනු කිරීම හේතුවෙන් අරමුණු ඉටු කිරීම තව දුරටත් ප්‍රමාද වී තිබුණි.

(ii) මෙම බූදලයට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාතේ නුවරගම් කෝරළයේ, රත්මලේතුලානේ, පොතානේගම පිහිටි ලොට් අංක 1 සහ 2 වශයෙන් දැක්වෙන අක්කර 18 රූඩ් 03 පර්චස් 01 ක් විශාල ඉඩම හා ලොට් අංක 3 වශයෙන් දැක්වෙන අක්කර 17 රූඩ් 02 පර්චස් 23 විශාල ඉඩම සඳහා මහා භාරකාරතැන විසින් 2000 ජූලි 04 දින තාවකාලික බදුකරුවෙකු පත් කර තිබුණි. එහෙත් දේපළ ආරක්ෂාව, වගා කටයුතු, බදු ආදායම් හා බදු කොන්දේසි සඳහා විධිමත් බදු ගිවිසුමකට එළඹීමට 2020 ජනවාරි වනවිටත් කටයුතු කර නොතිබුණි. නිශ්චිත වශයෙන්ම අද ගොවියා විසින් වගාකළ කුඹුරු අක්කර ගණන කොතෙක්ද, අදාළ කන්නයේ වී සඳහා වූ සහතික මිල කොතෙක්ද හා පොල් ඉඩමෙන් වගා කළ ප්‍රමාණය හා අස්වැන්න කොතෙක්ද ඒ අනුව ප්‍රවේණි ලැබීම නිවැරදි ද යන්න සම්බන්ධයෙන් මහාභාරකාර දෙපාර්තමේන්තුව විසින් කිසිදු අවස්ථාවක අධීක්ෂණයක් හෝ පසු විපරමක් කර නොතිබුණු අතර අද ගොවියා විසින් ඔහුගේ මනාපය පරිදි ගෙවන ප්‍රවේණිය, භාරගෙන ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අක්කර 36 රූඩ් 1 පර්චස් 24 කින් ලද ආදායම රු.3,575,542 ක් පමණි.

(iii) මෙම බූදලයට අයත් අනුරාධපුර පැරණි නගරයේ කුරුණෑගල පාරේ අංක 238 හා 239 දරන වෙළෙඳ ගොඩනැගිල්ල හා පිහිටි භූමිය විධිමත් ගිවිසුමකින් තොරව බදු දී තිබුණු අතර 2000 වර්ෂයේ මාර්තු සිට බදුකරු බදු මුදල් ගෙවීම පැහැර හැර තිබූ අතර ඉන් අනතුරුව එම දේපළ කළමනාකරණය සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(iv) අනුරාධපුර නව නගරයේ හරිස්චන්ද්‍ර මාවතේ අංක 48/388 දරන ස්ථානයේ පිහිටි ව්‍යාපාරික ගොඩනැගිල්ල හා ඉඩම සම්බන්ධයෙන් වූ අංක 14289/එල් දරන නඩුවේ තීන්දුව ප්‍රකාරව දේපළ නිරවුල් කර ගෙන විධිමත්ව බදු දී බූදලය නමින් ආදායම් ඉපයීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.3.4 දේපළ කළමනාකරණය

විවිධ බූදලයන් යටතේ පවරා දෙන ලද වතු දේපළ 10 ක් මහා භාරකාරතැන විසින් කළමනාකරණය කරනු ලබන අතර එම දේපළ විධිමත්ව කළමනාකරණය කර ඒවායේ ආදායමින් ස්ථාපකගේ අරමුණු ඉටුකිරීම අපේක්ෂා කෙරේ. මෙසේ පැවරී ඇති දේපළ පහත පරිදි වේ.

| බූදලයේ නම | වත්තේ නම | පිහිටීම | ප්‍රධාන වගාවන් |
|---|---|---|---|
| හැරී හපුගොඩ බූදලය | සුදුවැලිපොත වත්ත | බද්දේගම | පොල්, රබර් |
| | මත්තක වත්ත | නියාගම | තේ |
| එන්. ඩී. ඒ. සිල්වා විජේසිංහ බූදලය | රිච්මන්ඩ් පාක් වත්ත | කළුතර | පොල්, රබර් |
| | ඉරහඳයාව වත්ත | හේනේගම | පොල් |
| ඒ.ඒ. එල්. ද අල්විස් බූදලය | මළුවහේනවත්ත | මීරිගම | පොල් |
| ඩී.බී. ජයතිලක බූදලය | පිටකන්ද වත්ත | දොඩන්ගස්ලන්ද | පොල් |
| එන්.ඩී.එස්. සිල්වා බූදලය | ලබුහේන වත්ත | කුරුණෑගල | පොල් |
| මුහන්දිරම් ජයවික්‍රම බූදලය | තිස්සමහාරාමය | ගොඩ / මඩ ඉඩම් | වී |
| මෙන්ඩිස් සිල්වා බූදලය | තිස්සමහාරාමය | ගොඩ / මඩ ඉඩම් | වී |
| එච්.ඒ. ද සිල්වා බූදලය | තෝප්වත්ත | හොරණ | රබර් |

(අ) පසුගිය වසර හතරකදී වතුවලින් ලද ආදායම පිළිබඳ පරීක්ෂාවේදී 2016, 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් රු.3,744,310 ක, රු.9,336,629 ක හා රු.3,984,175 ක ලාභයක්ද, 2019 වර්ෂයේදී රු.6,222,482 ක අලාභයක් ලබා තිබුණි. ආදායම්, වියදම් හා ලාභය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇමුණුම 03 හි දැක්වේ. වතු ආදායමෙහි උච්චාවචනයන් දක්නට ලැබුණු අතර 2019 වර්ෂයේදී අලාභ ලබන තත්ත්වයට පත්වී තිබුණි. මෙම වතුවල ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කිරීම තුළින් අදාල බූදල් හිමිකරුවන්ගේ අරමුණු ඉටුකිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැතිබව නිරීක්ෂණය විය.

(ආ) හැරී හපුගොඩ බූදලයට අයත් ගාල්ල නියාගම ප්‍රදේශයේ පිහිටි මුළු වපසරිය අක්කර 17ක් වූ මත්තක වත්ත කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම වත්තෙහි අක්කර 15 රූඩ් 2 පර්චස් 38 ක භූමිය සම්බන්ධයෙන් පමණක් දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමුකර තිබූ අතර ඉතිරි ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබුණි. එම ඉඩම් නිශ්චිතව හඳුනාගෙන

ආරක්ෂිත මායිම් නිරවුල් කර ආරක්ෂිත වැට ඉදිකර කෘෂිකාර්මික කටයුත්තක් සඳහා යොදවා ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ii) අක්කර 15 රූඩ් 2 පර්චස් 38 ක ප්‍රමාණය A සිට E දක්වා කොටස් 5කට බෙදා වෙන්කර තිබූ අතර A, D හා E කොටස්වල යම් ප්‍රමාණයක් තේ වගාකර තිබූ අතර B හා C කොටස්වල වල් බිහි වී තිබුණි. එම තේ වගාව අවුරුදු 20කට වඩා පැරණි බව නිරීක්ෂණය වූ අතර පැළ සිටුවා නොතිබීමෙන් තැන තැන හිස් බිම් බොහෝමයක් නිරීක්ෂණය විය.

(iii) අක්කරයකට වගා කළයුතු සාමාන්‍ය තේ ගස් ප්‍රමාණය 5,000 ක් වන අතර මාස 3කට වරක් අක්කරයකට කිලෝග්රෑම් 150 ක් පොහොර යෙදිය යුතු වේ. ගස් සම්බන්ධයෙන් සංගණනයක් කර නොමැති බැවින් වගා කර ඇති ගස් ගණන සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවෙහි තොරතුරු නොවීය. 2019 වර්ෂයේදී පහත සඳහන් පරිදි පොහොර යොදා තිබුණු අතර අක්කරයක සිටුවා ඇති පැළ ගණන පිළිබඳ තොරතුරු නොවූයෙන් පොහොර ප්‍රමාණය ප්‍රමාණවත් ද යන්න ඇගයීමට නොහැකි විය. කෙසේ වෙතත්, කිසිඳු ඉඩම් කොටසක් සඳහා මාස 3කට වරක් පොහොර යොදා නොතිබුණි.

| | ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | පොහොර යෙදූ ඉඩම් කොටස | ඉඩම් කොටසෙහි විශාලත්වය |
|---|---|---|---|
| 2019/04/26 | 350 | A, B,C | අක්කර 5 රූඩ් 3 පර්චස් 32 |
| 2019/04/30 | 200 | D | අක්කර 5 රූඩ් 2 පර්චස් 34 |
| 2019/05/02 | 250 | D | අක්කර 5 රූඩ් 2 පර්චස් 34 |
| 2019/05/09 | 300 | D | අක්කර 5 රූඩ් 2 පර්චස් 34 |
| 2019/10/03 | 300 | E | අක්කර 4 පර්චස් 12 |
| 2019/10/11 | 300 | A, B, C | අක්කර 5 රූඩ් 3 පර්චස් 32 |
| | 1,700 | | |

(iv) වතු බංගලාව අබලන් තත්ත්වයේ පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයෙන් නඩත්තු කටයුතු දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය කෙරේ. මෙම වත්ත සඳහා වතු මුරකරුවෙකු සේවයේ යොදවා නොමැති අතර දෛනික පොලිස් මුර සංචාර සේවයක්ද ලබා ගෙන නොතිබුණි. දෛනික වැටුප ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දළු නෙලන්නන්ගේ පැමිණීම ඉතා දුර්වල මට්ටමක පැවති බව පැමිණීමේ ලේඛනවලින් තහවුරු විය. මෙම පරිපාලනමය දුර්වලතා පිළිබඳ

සලකා බලන විට අක්කර 17 ක් වූ ඉඩම් ප්‍රමාණය ඵලදායී අයුරින් කළමනාකරණය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.



මත්තක වත්තෙහි වල් බිහිවී ඇති ආකාරය;

(ආ) ඉහත දක්වන ලද බූදලයටම අයත් සුදුවැලිපොතවත්තෙහි වතු දේපළ කළමනාකරණය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සුදුවැලිපොතවත්තෙහි අන්කුටුදුව නැමැති බිම් කොටසෙහි අක්කර 13.5 ක පමණ රබර් වගාකළ ඉඩමෙහි රබර් ගස් කිහිපයකින් පමණක් වර්තමානයේදී රබර් කිරි ලබාගන්නා අතර දිනකට එක් කම්කරුවකු පමණක් රබර් කිරි කපනු ලැබේ. බොහොමයක්ගස් ඉවත් කර නැවත පැළ වගාවන් සිදු කළ යුතු මට්ටමේ පවතින බව නිරීක්ෂණය විය. අනවසර ඉදිකිරීම් කිහිපයක්ද මෙම වත්තෙහි පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) වතු බංගලාවෙහි වහලෙහි පරාල හා ජනෙල් උළුවහු දිරාපත් වී තිබුණු අතර වහලෙහි ඇතැම් කොටස් ඉටිකොළ වලින් ආවරණය කර තිබුණි. එම බංගලාවෙහි වතු අධිකාරී සහ ක්ෂේත්‍ර නිලධාරියෙකු නවාතැන්ගෙන සිටියද, අබලන් තත්ත්වය හේතුවෙන් නවාතැන් ගැනීමට සුදුසු මට්ටමක නොමැති බවත්, කඩිනම් පිළිසකර කිරීමක් අවශ්‍ය බවත් නිරීක්ෂණය විය.



අබලන් තත්ත්වයේ පවතින සුදුවැලි පොත වත්තේ වතු බංගලාව

### 3.3.5 මුදල් කළමනාකරණය සම්බන්ධයෙන් ජනතාවට සමීපවීමේ මට්ටම

විවිධ අනපනත් හරහා දෙපාර්තමේන්තුවට සුවිශේෂී කාර්යභාරයක් පැවරි ඇති අතර ඒ අනුව දෙපාර්තමේන්තුවෙන් විවිධ පාර්ශවයන්ට විවිධ සේවාවන් සපයනු ලබයි. එහෙත් දෙපාර්තමේන්තුවෙන් ඉටුකරන කාර්යයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. දෙපාර්තමේන්තුව නමින් වෙබ් පිටුවක් සකස් කර තිබුණද, එය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පරිශීලනය කිරීම සඳහා පහසුකම් සලසා නොතිබුණි. තවද, දෙපාර්තමේන්තුවේ පසුබිම, මහාභාරකාරතැනගේ කාර්යභාරය හා එක් එක් අංශවල කාර්යභාරය පමණක් එහි ඇතුළත් කර තිබුණු අතර, මහජනතාවට විස්තරාත්මක තොරතුරු ලබාගත හැකි වන පරිදි සහ සිය දේපළවල භාරකරු ලෙස මහාභාරකාරතැන පත්කිරීම සඳහා උනන්දුවක් ඇතිවන පරිදි තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

උදා -:

(i) එක් එක් වර්ෂවලදී ලබා දෙන ලද ශිෂ්‍යාධාර, වෛද්‍යාධාරහා පුණ්‍යාධාර ආදි විවිධ ආධාර පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම තුළින් ආධාර අපේක්ෂිත පුද්ගලයින් දැනුවත් කිරීමක් සිදුවන අතර, එවැනි පුණ්‍ය කටයුතු සඳහා සිය දේපළ

පැවරීමට කැමැත්තක් දක්වන පිරිස් බිහිවීම තුළින් සමාජීය වශයෙන් අගනා සේවයක් ඉටුකිරීමේ හැකියාව පවතිනු ඇත.

(ii) ශිෂ්‍යාධාර ඉල්ලුම් පත්‍ර වෙබ් පිටුව හරහා බාගත කළ හැකිබව දක්වා තිබුණ ද වෙබ් පිටුවතුළ එවැනි පහසුකම් සලසා නොතිබුණි.

**4. නිර්දේශයන්**

**4.1 සැලසුම් කිරීම**

(අ) දෙපාර්තමේන්තුවෙහි අරමුණු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකර හැකි පරිදි ආයතනික කාර්යභාරය හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය සම්පත් හා කාලය නිර්ණයකර කෙටිකාලීන හා දිගුකාලීන සැලසුම් සකස් කිරීම කළයුතු වීම හා එය ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා කාලීනව කාර්යසාධන ඇගයිය යුතුය.

(ආ) දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම සඳහා ඉවහල් වන ආකාරයට සියලු බූදල් හා භාර සම්බන්ධ විස්තරාත්මකව තොරතුරු දැක්වෙන පරිදි තොරතුරු පද්ධතියක් පවත්වා ගත යුතු වීම හා එම පද්ධතිය සඳහා තොරතුරු යාවත්කාලීන කිරීමේ වගකීම නිශ්චිත නිලධාරියෙකුට පැවරිය යුතුය.

**4.2 දේපළ කළමනාකරණය**

(අ) හඳුනානොගත් ඉඩම් හා දේපළ හඳුනාගැනීමට කටයුතු කර මහා භාරකාරතැනගේ අයිතිය තහවුරුකර ගැනීම සහ වන්දි ලබා නොගත් ඉඩම්වලට අදාල වන්දි ලබා ගැනීම සඳහා වන්දි ගෙවිය යුතු පාර්ශවයන් සමඟ සාකච්ඡා කළ යුතු අතර වන්දි ලබාගැනීම සම්බන්ධ වාර්තා හා ලේඛන විධිමත් පරිදි නඩත්තු කළ යුතුය.

(ආ) නෛතික බලපත්‍ර ලබාගෙන ඇත්නම් පමණක් බූදල් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම, බූදල්කරුවන්ගේ අරමුණුවලට පටහැනි කාර්යයන් සඳහා බූදල් දේපළ උපයෝජනය නොකළයුතු වීම හා දේපළවලට අගතියක් නොවන අයුරින් දේපළ කළමනාකරණය කළ යුතු වීම.

(ඇ) බාහිර පාර්ශවයන්ට බූදල් දේපළ බදු පදනමින් ලබා දෙන අවස්ථාවලදී දේපළවල ආරක්ෂාවත්, දේපළවලින් සාධාරණ ආදායමක් ලැබීමත් තහවුරු කිරීම සඳහා විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතු වීම හා බදු පැහැර හැර ඇති දේපළ නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කළ යුතු වීම.

(ඈ) ආරක්ෂිත සේප්පුවල පවතින භාණ්ඩ හා ලියවිලි අතරින් හිමිකරුවන් හඳුනාගත හැකි භාණ්ඩ සම්බන්ධයෙන් බූදලයෙහි අරමුණු ප්‍රකාරව කටයුතු කළ යුතු අතර හඳුනාගත නොහැකි භාණ්ඩ අධිකරණයට ඉදිරිපත් කර අධිකරණ අවසරය සහිතව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඉ) වංචල දේපළ පරීක්ෂාකර භාර ගැනීමේදී, එහි විනිවිදභාවය ආරක්ෂා වීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන්ට අමතරව, ස්වාධීන පාර්ශවයන් (උදාහරණ ලෙස නීතිඥයකු, අමාත්‍යාංශයේ නිලධාරියෙකු) සහභාගී කරවා ගැනීම හා දේපළ ලැයිස්තුගත කිරීමේදී ඒ සඳහා සහභාගී වූ සියලුම නිලධාරින්ගේ අත්සනින් යුක්තව ලැයිස්තු සකස් කළ යුතුය.

(ඊ) ඓතිහාසික වටිනාකමකින් යුත් භාණ්ඩ සංරක්ෂණය කිරීමට පියවර ගත යුතු අතර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සියලුම බූදල්වලට අදාල ඉඩම්වල දෙපාර්තමේන්තුවේ නම සඳහන් නාම පුවරු ප්‍රදර්ශනය කලයුතුය.

(උ) විකිණීම සඳහා අධිකරණ අවසරය ලද ඉඩම් හා ගොඩනැඟිලි විකුණා බූදලයේ අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතු අතර හඳුනානොගත් ඉඩම් හඳුනාගෙන මැනීම් කටයුතු සිදුකර මහා භාරකාරතැනගේ අයිතිය තහවුරුවන පරිදි ආරක්ෂා කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

(ඌ)2020 හා 2021 වර්ෂ සඳහා වතුවල නැවත වගා කිරීම සඳහා සකස් කළ සැලසුම් නැවත සමාලෝචනය කර අවශ්‍ය සංශෝධනයන් සිදු කර ක්‍රියාත්මක කළ යුතු වීම.

(එ) අනවසර ඉදිකිරීම් පවතින වතුවල මැනුම් කටයුතු සිදුකර අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නෛතික පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර ආරක්ෂිත වැටවල් ඉදිකර නොමැති වතුවල ආරක්ෂිත වැට ඉදිකිරීමටත් ආරක්ෂිත වැට කඩොලු කැඩී ඇති ස්ථාන පිළිසකර කිරීමටත් කටයුතු කළ යුතුය.

(ඒ) වගා නොකළ බිම්වල එම වත්තට අදාල ප්‍රධාන බෝගය හැර වර්තමානයේ වාණිජ වටිනාකමින් ඉහළ වෙනත් බෝග වගාවන් ආරම්භ කිරීමේ ශක්‍යතාවය පිළිබඳව අවධානය යොමු කළ යුතු අතර (උදා - ගම්මිරිස්, පළතුරු වර්ග) හා නැවත වගා කිරීම් සඳහා රජයේ සහනාධාර ලබාගැනීමේ හැකියාව සලකා බැලිය යුතුය.

(ඔ) වතු අධිකාරීවරුන්ට වැඩ හා වගකීම් ලිඛිතව පැවරිය යුතු වීම හා වතු සම්බන්ධයෙන් වතු අධිකාරීවරුන් විසින් පවත්වාගෙන යායුතු ලේඛන විධිමත් අයුරින් පවත්වා ගැනීම සඳහා ලිඛිත උපදෙස් ලබාදිය යුතු වීම.

(ඕ) වතුවල සිටුවා ඇති ගස් සම්බන්ධයෙන් සංගණනයක් සිදු කිරීම හා පැරණි රබර් ගස් කපා විකුණා ලබන ආදායම් නැවත වගා කිරීම සඳහා වන පිරිවැයෙන් යම් ප්‍රමාණයක් ආවරණය කර ගැනීමට කටයුතු කිරීම.

(ක) රිච්මන්ඩ් මන්දිරයේ ශිෂ්‍ය නේවාසිකාගාරය පිළිසකර කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර එය පිළිසකර කිරීමේ කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු අතර මන්දිරයේ වහලය සහ අනෙකුත් අබලන්වූ ස්ථාන පිළිසකර කර ආකර්ශනීය ස්ථානයක් බවට පත් කළ යුතුය.

(ග) අරමුදල් ඵලදායි ආයෝජනවල යෙදිය යුතු අතර හා ආයෝජන ලේඛන ඇතුළුව සියලුම ලේඛන විධිමත්ව පවත්වා ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම හා අධීක්ෂණ කටයුතු විධිමත් කළ යුතුය.

**4.3 පරිපාලන කටයුතු**

(අ) පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ජ්‍යේෂ්ඨ මට්ටමේ තනතුරක් අනුමත කර ගැනීම හා සංවිධාන ව්‍යූහය ප්‍රතිසංවිධානගත කළ යුතුය.

(ආ) තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම, සියලුම නිලධාරීන්ට ලිඛිතව වගකීම් පැවරීම, කාර්යසාධන ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම හා මාසිකව/ කාර්තුමය වශයෙන් කාර්යසාධනය ඇගයීම සිදුකළ යුතුය.

(ඇ) 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කලයුතුය.

(ඈ) ලිපිගොනු ලේඛනගත කිරීම හා පවත්වා ගැනීම සඳහා පොදු ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතු අතර එකම බුදලය/ භාරය සඳහා එක් ලිපිගොනුවකට වැඩි ප්‍රමාණයක් පවතින අවස්ථාවලදී ක්‍රමානුකූලව අංකනය කර පවත්වාගත යුතුය.

(ඉ) දෙපාර්තමේන්තුවේ නීති කටයුතු වෙනුවෙන් පෙනී සිටීමට කැමැත්ත දක්වන නීතිඥයින්ගෙන් සමන්විත නීතිඥ මණ්ඩලයක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ස්ථාපිත කර ගැනීම හා එක් එක් නඩු කටයුතුවලදී ඉන් සුදුසු නීතිඥයකු විනිවිදභාවයෙන් යුක්තව පත්කර ගත යුතුවීම.

(ඊ) අරමුණු ඉටුකළ එහෙත් වත්කම් පවතින භාර/බුදල් හා මහාභාරකාර ආඥා පනතේ 43 වන වගන්තිය ප්‍රකාරව වර්ෂ 12 ක කාලය තුළ දී අර්ථලාභීන් සොයාගත නොහැකි වූ භාරවලට අදාලව පවතින මූල්‍ය වත්කම්වලින් අරමුදලක් පිහිටුවා නීති වියදම් දැරීමේ හැකියාවක් පවතී ද යන්න පිළිබඳ අධිකරණයේ උපදෙස් ලබාගැනීමට කටයුතු කල යුතුය.

**4.4 ලිපිගොනු කළමනාකරණය**

(අ) අන්තිම කැමති පත්‍රය, අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය, දේපළ සම්බන්ධ වැදගත් ලේඛන හා නඩු තීන්දුවල මුල් පිටපත් සේප්පුවක ආරක්ෂිතව පවත්වා ගත යුතුය.

(ආ) 1992 වර්ෂයට ප්‍රථම මහාභාරකාරතැන වෙත තැන්පත්කර ඇති අන්තිම කැමති පත්‍ර හිමිකරුවන් සම්බන්ධ තොරතුරු රැස් කිරීම සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත්වල සහ අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවල දැන්වීම් පල කිරීමට කටයුතු කල යුතුය.

**4.5 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.**

(අ) මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අනුගමනය කරනු ලබන ගිණුම්කරණ රාමුව (පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ආදි ලෙස) හා ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය.

(ආ) වෙනත් මුදල්වලට ගෙවිය යුතු හා වෙනත් මුදල්වලින් ලැබිය යුතු වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම හා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සියලු මුදල්වලට අදාල චංචල හා නිශ්චල දේපළ තක්සේරු කර සාධාරණ අගය ගිණුම් ගත කළ යුතුය.

**4.6 මහජනතාව සමඟ සම්බන්ධ වීම.**

(අ) වෙබ් පිටුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම යාවත්කාලීනව පවත්වාගෙන යාම සහ අන්තිම කැමති පත්‍රයක් ලිවීම සම්බන්ධ උපදෙස් හා ආකෘති, ශීඝ්‍රාධාර හා වෛද්‍යාධාර ආදි ආධාර ඉල්ලුම් පත්‍ර ආදිය වෙබ් පිටුව හරහා බාගත කිරීමේ පහසුකම් සැලසීමට කටයුතු කල යුතුය.

(ආ) ජනතාවගේ අදහස්, යෝජනා හා පැමිණිලි භාර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට කටයුතු කල යුතුය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

2021 අප්‍රේල් 30 දින

**ඇමුණුම 1**

**(අ) ස්ථාවර වත්කම් ගිණුම්වලට ඇතුළත් කර නොමැති බූදල්**

| බූදලය | වත්කම / ඉඩම / දේපළ නම | අද්මිනිස්ත්‍රාසි පත්‍රය ලද දිනය |
|---|---|---|
| (i) ශ්‍රීමාඉන්ද්‍රානි ද සොයිසා | - No.151 B, හයිලේවල් පාර, නුගේගොඩ (පර්චස් 12.5 ක් වූ ඉඩම හා නිවස)<br>- නුගේගොඩ ලංකා බැංකු අධිශ්‍රේණි ශාඛාවේ ලොකර් අංක 738හි තැන්පත් කර තිබූ ස්වර්ණාභරණ | 2009.07.20 |
| (ii) වීරසිංහ අබේනායක බූදලය | - මාතර ගබඩා වීදියේ පුංචිපතහෙවත්ත 'බී' අක්ෂරය දරන කැබැල්ලෙන් බෙදූ අංක 03 දරන පර්චස් 32 ක් විශාල ඉඩම හා ගොඩනැඟිල්ල සහ අංක 06 දරන පර්චස් 37 විශාල ඉඩම හා ගොඩනැඟිල්ල<br>- බස්නාහිර ගිරුවාපත්තුවේ පොල්මොටේගම පිහිටි මෝදරමුනේයාය - පර්චස් 72 ක ඉඩම. | 1982 මාර්තු 30 |
| (iii) ආර්.එල්.එච්. චන්ද්‍ර සේකර බූදලය | - අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාතේ හෙනානේගම පිහිටි බලයලත් මිනින්දෝරු එස්.කේ.කෙලන්බර්ග් විසින් 1930.02.23 දින අඳින ලද පිඹුරේ ලොට් අංක 1 සහ 2 අක්කර- 18 රූඩ් 03 පර්චස් 01<br>- එම පිඹුරේ ලොට් අංක 3 - අක්කර 17 රූඩ් 02 පර්චස් 23<br>- අනුරාධපුර නව නගරයේ හරිස්චන්ද්‍ර මාවතේ අංක 48/388 දරන ස්ථානයේ ඉඩම හා නිවස<br>- අනුරාධපුර පැරණි නගරයේ කුරුණෑගල පාරේ අංක 238 හා 239 දරන වෙළෙඳ ගොඩනැඟිල්ල හා ඉඩම | 2003 ජුනි 04 |

| | | |
|---|---|---|
| (iv) අයි.ඩබ්.සී.විජේ රත්න බූදලය | නෝටර්න් බ්‍රිජ් හි පිහිටි නිවස | 1990.06.14 |
| (v) නිහාල් පීරිස් බූදලය | රත්මලාන අංක 57 දරන නිවස | 2007.10.02 |
| (vi) යූ.ඩී.බී. ද සිල්වා බූදලය | 220/1, කෙලින් වීදිය, හල්දුම්මුල්ල (නිවස) | 1994.01.31 |

**ඇමුණුම 2**

| නිවාස/ දේපළ | 1973 ඔක්තෝබර් 17 දිනට වටිනාකම |
| --- | --- |
| -------------------- | ------------------- |
| | රු. |
| බෝකුන්දර පිළියන්දල, මාපිටියගෙවත්ත හා දෙල්ගහවත්ත පිහිටි අංක 137, 138, 139, 145, 146, 147, 148, 149, 150 හා 159 දරන නිවාස අක්කර 7 රූඩ් 2 පර්චස් 25.62 | 51,100 |

කුඹුරු ඉඩම්

----------------

| | | |
| --- | --- | --- |
| i. | වේරහැර වලබායපොත කුඹුර අක්කර 4 රූඩ් 3 පර්චස් 38 | 3,000 |
| ii. | වේරහැර බොරුපනගේ කුඹුර බුසල් 9 | 500 |
| iii. | ගොරොක්ගහ කුඹුර අක්කර 3 | 2,000 |
| iv. | තුම්බෝවිල රුවල්ගේ කුඹුර රූඩ් 3 පර්චස් 28.5 | 750 |
| v. | කුරුදුගහ කුඹුර රූඩ් 3 පර්චස් 30 | 750 |
| vi. | යක්දෙස්ස කුඹුර | 2,000 |
| vii. | තුම්බෝවිල අක්කර 1 පර්චස් 30 ක කුඹුර | 500 |
| viii. | බණ්ඩිපිටිය කුඹුර අක්කර 3 පර්චස් 18 | 2,500 |
| ix. | අස්වැද්දුම කුඹුර රූඩ් 1පර්චස් 14.35 | |
| x. | දෙල්ගහවත්ත කුඹුර අක්කර.2 රූඩ්.2 පර්චස් 16 | |
| xi. | දෙල්ගහවත්ත කුඹුර රූඩ්.2 | |

**ඇමුණුම 3**

**එන්. ඩී. එස්. සිල්වා විජේසිංහ බූදලයට අදාල අන්තිම කැමති පත්‍රය ප්‍රකාර කෞතුක භාණ්ඩ ලැයිස්තුව**

i. බකිංහැම් මාළිගයේ පැවැත්වූ මුදලිතුමා පිළිගැනීමේ උත්සවය සිහිවීම පිණිස අති උත්තම පස්වන ජෝර්ජ් රජු විසින් පිරිනමන ලද දියමන්ති හා රතුකැට ඔබ්බවූ රාජකීය සංකේතය.

ii. බෙල්ජියමේ II ලියෝපෝල්ඩ් ගරු බල සේනාවේ (Order of Leopold II of Belgium) නයිට් කොමාන්ඩර් තනතුරේ රන් නිල ලාංඡනය හා පත්කිරීම.

iii. මහනුවර ප්‍රධානීන් විසින් පිරිණමන ලද විශාල රන් පදක්කම.

iv. ලංකාවේ මහජනතාව විසින් පිරිනමන ලද විශාල රන් පදක්කම.

v. විශාල Papal Reconciliation පදක්කම.

vi. ශුද්ධ වූ සෙප්ල්කර් ගරු බල සේනාවේ (Order of Holy Sepulcher) නයිට් ග්‍රෑන්ඩ් කොමාන්ඩර්ගේ දියමන්ති තරුව හා බඳ පටිය හා එකී ගරු බල සේනාවේ සම්පූර්ණ නිල ඇඳුම සහ පත්කිරීම.

vii. කුඩා පාප් රන් පදක්කම් (Papal Gold Medal) තුන

viii. ශාන්ත සිල්වෙස්ටර්ගේ ගරු බල සේනාවේ (Order of St. Sylvester) නයිට් ග්‍රෑන්ඩ් කොමාන්ඩර්ගේ දියමන්ති තරුව හා බඳ පටිය, එකී ගරු බල සේනාවේ සම්පූර්ණ නිල ඇඳුම සහ පත්කිරීම.

ix. කළුතර ප්‍රදේශවාසීන් විසින් පිළිගන්වන ලද විශාල රිදී ස්තුති පත්‍රය.

x. ඉතාලි කිරුළෙහි නයිට් තනතුරේ (Knight Grand Officer) රන් හා එනමල් කුරුසය හා තරුව සහ පත් කිරීම.

xi. පඩිකාර මුදලිගේ රන් කඩුව හා බඳ පටිය සහිත සම්පූර්ණ නිල ඇඳුම.

xii. රාජකීය ලිපි හා සමරු අත්සන් යෙදූ රාජකීයයන්ගේ ඡායා රූප සහිත ඇල්බමය.

xiii. කලා විද්‍යා සංගමයේ (Society of arts, Science) Gold Cross of Merit හා පත් කිරීම ඇතුළු ප්‍රංශයේ ලිපි.

xiv. ප්‍රංශයේ චාලමේන් ගරු බල සේනාවේ (Order of the Crown of Charlemagne) Grand Cross ට අදාල තරුව හා බඳ පටිය.

xv. ජර්මනියේ බ්ලැක් ඊගල් ගරු බල සේනාවේ (Order of Black Eagle) නයිට් කොමාන්ඩර්ගේ රිදී ලාංඡනය හා කර පටිය සහ පත් කිරීම.

xvi. පෘතුගීසි රජයේ Cross of Devotion හි ලාංඡනය හා අධිකාර පත්‍රය.

xvii. පෝලන්ත යුද්ධ අමාත්‍යාංශයේ (සිවිල් අංශය) Grand Officer of the Star ට අදාල ලාංඡනය හා අධිකාර පත්‍රය.

xviii. ස්පාඤ්ඤයේ ශාන්ත ජෝන් බෞතීස්ම කරන්නාගේ ගරු බල සේනාවේ (Order of St' John the Baptist of Spain) අධිකාර පත්‍රය හා Grand Cross.

xix. ඇමරිකා එක්සත් ජනපදයේ කෙන්ටකීහි කර්නල්වරුන්ගේ Honorary Life Commandership ට අදාල අධිකාර පත්‍රය.

xx. රෝමයේ පොන්ටිපිකල් ඇකඩමියෙහි සාමාජිකත්වය පිළිබඳ අධිකාර පත්‍රය.

xxi. ශාන්ත ජෝන් ලැටරන්ගේ ගරු බල සේනාවේ (Order of St. John Lateran) Grand Cross ට අදාල අධිකාර පත්‍රය.

xxii. වඩාත් වටිනාම කෞතුක වස්තුව වන වතිකානු තීන්දු ප්‍රකාශය සහිත රන් ආලේපිත කරඬුව සමඟ අති උතුම් xi වන පාප් වහන්සේ විසින්පිරිනමන ලද සත්‍ය කුරුසය (True Cross)

**ඇමුණුම 4**

**වතු අංශයේ මූල්‍ය ප්‍රගතිය**

| **වත්ත** | | **2016** | **2017** | **2018** | **2019** |
|---|---|---|---|---|---|
| --------------- | | ------ | ------ | ------ | ------ |
| සුදුවැලිපොත | ආදායම | 2,722,842 | 4,074,863 | 2,205,438 | 1,605,261 |
| | වියදම | 3,512,560 | 3,697,125 | 3,192,185 | 3,015,061 |
| | ලාභය/(අලාභය) | (789,718) | 377,738 | (986,747) | (1,409,800) |
| මත්තක වත්ත | ආදායම | 1,987,861 | 2,484,976 | 1,828,171 | 2,284,013 |
| | වියදම | 2,384,803 | 1,980,457 | 2,044,373 | 2,800,418 |
| | ලාභය/අලාභය | (396,942) | 504,519 | (216,202) | (516,405) |
| රිච්මන්ඩ් පාක් | ආදායම | 2,832,537 | 3,299,475 | 2,657,603 | 2,469,680 |
| | වියදම | 2,822,437 | 2,707,247 | 2,988,982 | 3,460,327 |
| | ලාභය/(අලාභය) | 10,100 | 592,228 | (331,379) | (990,647) |
| ඉරහඳයාව | ආදායම | 6,979,401 | 7,085,991 | 9,113,343 | 6,005,763 |
| | වියදම | 4,336,068 | 3,262,342 | 5,230,171 | 4,456,797 |
| | ලාභය/(අලාභය) | 2,643,333 | 3,823,649 | 3,883,172 | 1,548,966 |
| මළුවහේන | ආදායම | 1,378,113 | 1,340,000 | 1,590,554 | 1,015,863 |
| | වියදම | 1,017,579 | 1,306,659 | 1,589,124 | 1,557,252 |
| | ලාභය/(අලාභය) | 360,534 | 33,341 | 1,430 | (541,389) |
| පිටකන්ද | ආදායම | 3,112,316 | 5,258,846 | 6,156,553 | 4,395,255 |
| | වියදම | 3,066,440 | 3,523,500 | 4,617,322 | 7,309,960 |
| | ලාභය/(අලාභය) | 45,876 | 1,735,346 | 1,539,231 | (2,914,705) |
| ලබුහේන | ආදායම | 1,188,569 | 1,161,166 | 1,288,602 | 786,054 |
| | වියදම | 1,183,703 | 3,523,500 | 2,067,035 | 2,387,171 |
| | ලාභය/(අලාභය) | 4,866 | (2,362,334) | (778,433) | (1,601,117) |
| තෝප් වත්ත | ආදායම | 1,114,426 | 2,172,856 | 540,097 | 359,450 |
| | වියදම | 873,707 | 788,415 | 492,318 | 370,274 |
| | ලාභය/(අලාභය) | 240,719 | 1,384,441 | 47,779 | (10,824) |

| | | | | | |
|---|---|---|---|---|---|
| මුහන්දිරම් ජයවික්‍රම | ආදායම | 2,126,782 | 3,317,538 | 652,784 | 387,976 |
| (තිස්සමහාරාම) | වියදම | 1,138,942 | 1,048,795 | 589,076 | 1,178,094 |
| | ලාභය/(අලාභය) | 987,840 | 2,268,743 | 63,708 | (790,118) |
| මෙන්ඩිස් සිල්වා | ආදායම | 844,370 | 1,050,763 | 944,423 | 1,137,720 |
| (තිස්සමහාරාම) | වියදම | 206,668 | 71,805 | 182,807 | 134,163 |
| | ලාභය/(අලාභය) | 637,702 | 978,958 | 761,616 | 1,003,557 |
| | | **3,744,310** | **9,336,629** | **3,984,175** | **(6,222,482)** |

**ඇමුණුම 5**

**2015 සිට 2019 දක්වා හැරී හපුගොඩ බූදලයේ ආදායම**

| **වර්ෂය** | **බූදලය** | **ආදායම** | **වැය කළ හැකි මුදල 4/5** | **ඉතිරි කළ යුතු මුදල 1/5** |
|---|---|---|---|---|
| -------- | --------- | ---------- | -------------------- | ------------------ |
| | | රු. | රු. | රු. |
| 2015 | හැරී හපුගොඩ බූදලය | 106,456 | 85,165 | 21,291 |
| | මත්තක වත්ත | 2,462,475 | 1,969,980 | 492,495 |
| | සුදුවැලි පොත වත්ත | 3,098,584 | 2,478,867 | 619,717 |
| 2016 | හැරී හපුගොඩ බූදලය | 4,500 | 3,600 | 900 |
| | මත්තක වත්ත | 1,987,860 | 1,590,288 | 397,572 |
| | සුදුවැලි පොත වත්ත | 2,722,842 | 2,178,274 | 544,568 |
| 2017 | මත්තක වත්ත | 2,484,976 | 1,987,981 | 496,995 |
| | සුදුවැලි පොත වත්ත | 4,074,863 | 3,259,990 | 814,973 |
| 2018 | මත්තක වත්ත | 1,828,171 | 1,462,537 | 365,634 |
| | සුදුවැලි පොත වත්ත | 2,205,438 | 1,764,350 | 441,088 |
| 2019 | මත්තක වත්ත | 2,284,013 | 1,827,210 | 456,803 |
| | සුදුවැලි පොත වත්ත | 1,605,261 | 1,284,209 | 321,052 |
| | | **24,865,439** | **19,892,451** | **4,973,088** |